# පාරිභෝගිකයා ආරක්ෂා කිරීමෙහිලා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දායකත්වය





වාර්තාවේ අංකය : ටීඒසී/බී/සීඒඒ/පීඒ/2022

ජාතික විගණන කාර්යාලය

# පටුන


| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| ----------- | | ------------ | ---------- |
| **01** | | විධායක සාරාංශය | 1 |
| **02** | | හැඳින්වීම | 5 |
| | **2.1** | පසුබිම | 5 |
| | **2.2** | විගණනය සඳහා අධිකාරී බලය | 7 |
| | **2.3** | විගණන ප්‍රවේශය | 8 |
| | **2.4** | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග ඇති සම්බන්ධතාවය | 8 |
| | **2.5** | විගණන අරමුණු | 8 |
| | **2.6** | උප අරමුණු හා නිර්නායක | 8 |
| | **2.7** | විගණන විෂයපථය | 11 |
| | **2.8** | විගණන ක්‍රමවේදය | 11 |
| **03** | | විස්තරාත්මක විගණන සොයාගැනීම් | 12 |
| | **3.1** | ආයතනයට අදාල නෛතික පසුබිම ඇගයීම | 12 |
| | **3.2** | පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම | 12 |
| **04** | | නිර්දේශ | 32 |
| | | ඇමුණුම් | 34 |

## 1. විධායක සාරාංශය

පාරිභෝගිකයන්ගේ ජීවිත හා දේපලවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම, අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම, හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරගකාරි මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනයන් ලබාදීම යන අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේ අරමුණින් 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා තිබුණි.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට කල හැකි කාර්යභාරය ඉතා වැදගත් වේ. ඒ සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් විධිවිධාන සපයා ඇත. ඒ අනුව පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා පනතේ සඳහන් අරමුණු ලඟාකර ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය කටයුතු කර ඇති ආකාරය ඇගයීම සඳහා මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදී. ඒ අනුව මෙම විගණනයේ අරමුණ වනුයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා සිදු කරන කාර්යභාරයේ කාර්යසාධනය ඇගයීම වේ.

මෙම විගණනයේදී සිදු කරන ලද ප්‍රධාන නිරීක්ෂණයන් ලෙස 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේද ක්‍රියාත්මක විය යුතු වන 1979 අංක 01 දරණ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත යටතේ හඳුන්වා දී තිබූ පොදු විධාන 62ක් වර්තමානයට ගැලපීම් කිරීම සඳහා පත්කළ කමිටුවේ යෝජනා පරිදි ගැලපීම් සිදුකර නොතිබීම, පනත සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ වී සමාලෝචිත වර්ෂය වන විට වසර 19 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබීම, ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් උපරිම මිල සහතික නිකුත් කිරීමේදී උපරිම සිල්ලර මිල ලකුණු කර තිබිය යුතු බවට භාණ්ඩ වර්ග 05ක් සම්බන්ධයෙන් පමණක් විධාන නිකුත් කර තිබීම, භාණ්ඩ වර්ග විශාල ප්‍රමාණයක් වාර්ෂිකව රටට ආනයනය කළද එම භාණ්ඩ මිල ලකුණු කිරීම සඳහා අධිකාරියට නෛතික හැකියාවක් නොමැති වීම, අධිකාරියේ දත්ත පද්ධතිය ප්‍රකාරව ආනයනකරුවන් විසින් භාණ්ඩ මත සලකුණු කරනු ලබන මිල ගණන් වලට වඩා වැඩි මිලකට එම භාණ්ඩ වෙළඳපොලේ විකිණීමට තබා තිබීම හා ලේබල් සමාගම් හරහා ලකුණු කරන ලද ලේබල් ගලවා ඉවත් කර නැවතත් ලේබල් අලවා ඇති අවස්ථාවන් නිරීක්ෂණය කරන ලදී. එසේම භාණ්ඩ අදාළ ප්‍රමිත හා පිරිවිතර වලට අනුකූලදැයි තහවුරු කර ගැනීම සඳහා කරන ලද පරීක්ෂාවන් හිදී එසේ අනුකූල නොවූ භාණ්ඩ සම්බන්ධයෙන් ප්‍රමාද වී නීතිමය ක්‍රියාමාර්ග ගත් අවස්ථා 60ක් පවතින බවත් එම ප්‍රමාද කාලය මාස 03 සිට මාස 22ක් දක්වා පරාසයක පැවති බවත් නිරීක්ෂණය විය. එසේම

වෙළඳපොලේ පවතින විවිධ භාණ්ඩ වර්ග අතරින් ප්‍රමිත අනිවාර්ය කෙරෙමින් ගැසට් නිකුත් කිරීම භාණ්ඩ වර්ග 16කට පමණක් සීමා වී තිබුණි. එසේම, එසේ ප්‍රමිත අනිවාර්ය කරන ලද භාණ්ඩ වලට අදාලව සාම්පල් ලබාගෙන තිබේදැයි පරීක්ෂා කිරීමේදී භාණ්ඩ වර්ග 10 ක් සම්බන්ධයෙන් සාම්පල් පරීක්ෂාවක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය කරන ලදී.

පැමිණිලි සම්බන්ධයෙන් වූ කළ 2015 වර්ෂයේ සිට 2022 වර්ෂයේ ජුනි මස දක්වා පාරිභෝගික කටයුතු සභාව වෙත යොමු කර තිබූ පැමිණිලි 07ක් සම්බන්ධයෙන් තීරණ ලබාදී නොතිබීම, සභාව වෙත යොමු කරන ලද පැමිණිලි විසදීම සඳහා දිගු කලක් ගැනීම, 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,888 කින් පැමිණිලි 296 ක විමර්ශන කටයුතු 2022 දෙසැම්බර් 31 දින තෙක් නිම වී නොතිබීමද නිරීක්ෂණය කරන ලදී. එසේම කෘෂිකාර්මික උපකරණ සඳහා ලැබී ඇති පැමිණිලි සම්බන්ධව පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට ප්‍රතිපාදන නොමැති බවද එබැවින් පරීක්ෂා කර නියෝග ලබාදීමට හෝ නීතිමය පියවර ගැනීමට හැකියාවක් නොමැති බවද නිරීක්ෂණය විය.

එමෙන්ම රු.5,401,428 ක සමස්ත වියදමක් දරමින් හා මහජනයා අතර ප්‍රචාරණ කටයුතු කිරීම සඳහා රු.3,786,942 ක වියදමක් දරා අරඹා ඇති 1977 - පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය මඟින් පාරිභෝගික ජනතාවට තම පැමිණිලි සම්බන්ධයෙන් මාර්ගත පැමිණිල්ලේ අංකය හා විමර්ශනයේ ප්‍රගතිය දැනුම් දීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම හා දිස්ත්‍රික්ක කාර්යාල සමඟ සම්බන්ධ කිරීමෙන් දත්ත ඇතුලත් කිරීමට හැකි ක්‍රමවේදයක් සකස් කර නොතිබීම යන කරුණු නිරීක්ෂණය කරන ලදී. තවද වෙළඳපොළ අධ්‍යයනයන් සම්බන්ධයෙන් වූ කල එම අධ්‍යයනයන්හි ප්‍රතිඵල පාරිභෝගිකයා දැනුවත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා යොදාගෙන නොතිබීම ද නිරීක්ෂණය කරන ලදී.

වැටලීම් සම්බන්ධයෙන් වූ කළ 2018 – 2022 දක්වා කාලපරිච්ඡේදය තුල සිදු කර තිබූ සත්‍ය වැටලීම් සංඛ්‍යාව ඉලක්කගත වැටලීම් සංඛ්‍යාවට වඩා අඩු අගයක හෙවත් සියයට 56 සිට සියයට 74 දක්වා වූ පරාසයක පැවතීම, දිස්ත්‍රික්ක 08 ක වැටලීම් ප්‍රගතිය සියයට 52 කට වඩා අඩු අගයක පැවතීම, ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය සංවර්ධන නිලධාරීන් හා විමර්ශන නිලධාරීන් අනුයුක්ත කර තිබූ සංඛ්‍යාව සලකා බැලීමේදී දිස්ත්‍රික්ක 09 ක විමර්ශන නිලධාරීන් 23 ක් අතිරික්තව ද දිස්ත්‍රික්ක 12 ක විමර්ශන නිලධාරීන් 47 ක් අඩුවෙන් ද අනුයුක්ත කර තිබීම නිරීක්ෂණය කරන ලදී. එසේම 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිදු කරන ලද වැටලීම්වලින් වැටලීම් 3715කින් වැටලීම් 3616 ක නඩු පැවරීමට වර්ෂ දෙකකට අධික කාලයක් ගත වී තිබීමද නිරීක්ෂණය විය.

එසේම වෙළඳාම විධිමත් කිරීම සම්බන්ධයෙන් පනතේ වගන්ති අංක 9(අ) ප්‍රකාරව පාරිභෝගික සංවිධාන ප්‍රවර්ධනය කිරීම සඳහා අධිකාරිය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවද වගන්ති අංක 27 ප්‍රකාරව සෑම වෙළන්දෙකුම අධිකාරිය වෙත ලියාපදිංචි වියයුතු බවට දක්වා තිබුණද ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග

ගෙන නොමැති බවද වගන්ති අංක 56 ප්‍රකාරව නිශ්චය කරනු ලබන යම් ආකෘතියක් ප්‍රකාරව වාර්තා පවත්වාගෙන යාම සහ එම වාර්තා අධිකාරිය වෙත සැපයීම සම්බන්ධයෙන් නියමයන් කර නොතිබීමද නිරීක්ෂණය කරන ලදී. පනතේ වගන්ති අංක 10 යටතේ භාණ්ඩ මිල ලකුණු කිරීම, ලේබල් කිරීම හා ඇසිරීම් සම්බන්ධයෙන් නිකුත් කළ විධාන අතරින් වලංගු විධාන 8ක් සම්බන්ධව 2022 වර්ෂයේ කිසිදු දිස්ත්‍රික්කයක කිසිදු වැටලීමක් කර නොමැති බවත් විධාන අංක 15කට අදාළව සිදුකර ඇති වැටලීම් සංඛ්‍යාව 50කට අඩු බවත් නිරීක්ෂණය කරන ලදී.එසේම පනතේ වගන්ති අංක 12 යටතේ නිකුත් කරන ලද විධාන 18න් 11ක් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී වැටලීම් සිදුකර නොමැති බවත් වගන්ති අංක 16, 17 හා 34 සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මකවී නොමැති අවස්ථා පවතින බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

ඒ අනුව, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ හඳුන්වා තිබූ පොදු විධාන වර්තමානයට ගැලපීම සම්බන්ධයෙන් පත් කළ කමිටුව ඉදිරිපත් කර තිබුණු යෝජනා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධන කටයුතු කඩිනම් කිරීම, ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් උපරිම සිල්ලර මිල සහතික නිකුත් කිරීමට අවශ්‍ය වන භාණ්ඩ වර්ග තවදුරටත් හඳුනාගෙන වර්තමානයට ගැලපෙන ආකාරයට රටට ආනයනය කරනු ලබන භාණ්ඩ වර්ග ඇතුලත් කරමින් පුළුල් ආවරණයක් වන පරිදි නව විධානයක් නිකුත් කිරීම, එම භාණ්ඩ වල උපරිම සිල්ලර මිල සම්බන්ධයෙන් සහ උපරිම සිල්ලර මිල සහතික ලබා ගැනීමට අධිකාරියට තොරතුරු ඉදිරිපත් නොකරන ආනයනකරුවන් සම්බන්ධව වැටලීම් කටයුතු පුළුල් කිරීම, ආනයනකරුවන් විසින් උපරිම සිල්ලර මිල සහතික ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සඳහා අනුමැතිය ලබා දීමට පෙර එම මිල ගණන් සම්බන්ධව භෞතිකව පරීක්ෂා කිරීම , පැමිණිලි අංශයට ලැබෙන පැමිණිලි අතරින් අධිකාරියට විසඳිය නොහැකි පැමිණිලි අදාල ආයතන වලට යොමු කර පසු විපරම් කිරීම, පැමිණිලි අංශයෙන් විසඳීමට නොහැකි පැමිණිලි නීති අංශයට යොමු කර කෙටි කාලයකින් විසඳා පරිභෝගිකයාට සහන සැලසීමට පියවර ගැනීම, කෘෂි උපකරණ සම්බන්ධව ලැබෙන පැමිණිලි විසඳීමට පනතේ නීතිරීති ඇතුලත් කිරීම, ප්‍රමිති ආයතනය සමඟ එකඟ වී ආනයනය කරන යන්ත්‍ර සූත්‍රවල අදාල ප්‍රමිතීන් නියමයන් නියම කිරීම, වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවත් දත්ත පද්ධතියක් ඇති කිරීම, සාම්පල් පරීක්ෂා කිරිමේදී පාරිභෝජනයට නුසුදුසු බවට හෝ නියමිත ප්‍රමිතිය නොමැති බවට තහවුරු වන සාම්පල් සම්බන්ධව එම වෙළෙන්දන්ට හා නිෂ්පාදකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම,වෙළඳපල මිල ගණන් පාරිභෝගිකයාට දැන ගැනීමට හැකිවන ආකාරයට 1977 සේවාව සකස් කිරීම, 1977 මඟින් කරන පැමිණිලි සටහන් වූ බව පැමිණිලිකරුට නැවත දැන්වීමට ක්‍රමවේදයක් ඇති කිරීම, දත්ත පද්ධතියේ තොරතුරු ඇතුලත් කිරිමේදී සෑම දිස්ත්‍රික්කයකම එකම ආකාරයෙන් තොරතුරු ඇතුලත් කිරීම, විධාන අංක අනුව කරන වැටලීම් පිළිබඳව වෙන වෙනම දත්ත ලබාගත හැකි පරිදි තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම, වැටලීම් වලදී නඩු මඟින් දඩ අයකිරිමේදී එම අයකරන දඩ මුදල අදාල නඩුවට අයකර තිබේද යන්න හඳුනා ගත හැකි පරිදි දත්ත පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීමට

ක්‍රමවේදයක් ඇති කිරීම, වැටලීම් සිදු කර, නඩු පැවරීම් සිදු නොකළ වැටලීම් සම්බන්ධයෙන් නඩු පැවරීම් නොකිරීමට හේතු වන කරුණු සම්බන්ධව අධීක්ෂණය සිදු කිරීම, පනතේ විවිධ වගන්ති යටතේ මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ කරුණු සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත ප්‍රකාරව පැමිණිලි ලැබී මසක් ඇතුලත විසඳීමට කටයුතු කිරීම වැනි කරුණු වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා නිර්දේශයන් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

## 2. හැඳින්වීම

### 2.1 පසුබිම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ ස්ථාපිත කරනු ලැබූ අතර මේ වන විට මෙම ආයතනය වසර 19 කට අධික කාලයක් තම මෙහෙවර ඉටු කරමින් සිටී. අධිකාරිය ආරම්භයත් සමඟ ඒ වන විට පැවති සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව සහ අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව අහෝසි වූ අතර එම ආයතන මඟින් සිදුකල රාජකාරී සාපේක්ෂ හා කාලීන වශයෙන් වර්ධනාත්මකව සිදු කිරීමට, මෙම අධිකාරිය වෙත පැවරෙන ලදී.

ඇවර කරනු ලැබූ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව ක්‍රියාත්මක කළ ඒකාධිකාර ඒකාබද්ධ හා තරඟ විරෝධීචර්යා පාලනය හා ඒ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙන්ම අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුවේ අරමුණු වූ විවෘත ආර්ථික ක්‍රමය තුල වෙළෙඳාම විධිමත් කිරීම සහ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම යන කරුණු ද අධිකාරිය මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂා කර ඇත. මෙම කාර්යභාරය කාලීන සමාජ හා තාක්ෂණික අවශ්‍යතා ද සැලකිල්ලට ගනිමින් ඉටු කිරීමට අවශ්‍ය ඉඩකඩ ලැබෙන පරිදි පාරිභෝගික අයිතිවාසිකම් වඩාත් සුරක්ෂිත කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතින් විධිවිධාන සලසා තිබේ.

ඒ අනුව 1979 අංක 01 දරන පාරිභෝගික ආරක්ෂණ පනතෙහි හයවන වගන්තිය යටතේ නිකුත් කොට ඇති පොදු විධාන හා එම පනතේ අටවන වගන්තිය යටතේ නිශ්චය කරන ලද ප්‍රමිතීන් හා පිරිවිතරයන් අධිකාරිය විසින් නිකුත් කරන ලද විධානයක්, නිශ්චය කරන ලද ප්‍රමිතියක් හා පිරිවිතරයක් ලෙස සලකනු ලැබේ. 1979 අංක 01 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත සහ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව පිහිටුවන ලද 1987 අංක 01 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත යටතේ අපේක්ෂා කල අරමුණු හා කාර්යයන් වර්තමාන වෙළඳපල ක්‍රියාවලිය සමඟ යාවත්කාලීන කරමින්, මිල පාලනය කිරීමේ පනතෙහි ක්‍රියාවලිය ද සුදුසු පරිදි ඊට ඇතුලත් කරමින් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත ගොඩනඟා ඇති අතර එම කාර්යභාරය මේ වන විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් ඉටු කරමින් පවතී.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීමේ අරමුණු ලෙස පහත කරුණු හඳුනාගෙන තිබුණි.

(අ) පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපලවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.

(ආ) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

(ඇ) හැකි සෑම විටම, පාරිභෝගිකයන්ට, තරඟකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම.

(ඈ) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනයක් ලබාදීම.

අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යයන් සඳහා පනතේ විධිවිධාන සලසා තිබේ.

(අ) (i) ව්‍යවසායයන් අතර සීමාකාරී ගිවිසුම් :

(ii) ව්‍යවසායයන් අතර මිල පිළිබඳ වැඩ පිළිවෙලවල් :

(iii) වෙළෙඳපොළ ඇතුලත හෝ වෙළෙඳපොලේ සැලකිය යුතු කොටසක දේශිය වෙළෙඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම:

(iv) දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරිත්වය පිළිබඳ යම් අවහිරයක්:

පාලනය කිරීම හෝ ඉවත් කිරීම.

(ආ) තරඟ විරෝධි චර්යා හා ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ කිරීම;

(ඇ) භාණ්ඩ සහ සේවා සපයන තැනැත්තත් අතර ඵලදායී තරඟකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම;

(ඈ) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගත හැකිවීම සහ ඒවායෙහි තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, මිල දී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිත කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඉ) මිල දී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම;

(ඊ) මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම;

(උ) වෙළෙඳපොළ තරඟකාරිත්වය අඩු ඵලදායිතාවයෙන් පවතින අවස්ථාවල දී වෙළෙඳපොළෙහි තරඟකාරි මිල ප්‍රවර්ධනය කිරීම;

(ඌ) වෙළෙඳපොල තත්ත්ව සහ පාරිභෝගික කටයුතුවලට අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළකිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම;

(එ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාර ගැනීම;

(ඒ) පාරිභෝගිකයන්ගේ මනා සෞඛ්‍යය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපන ප්‍රවර්ධන කිරීම;

(ඔ) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කිරීම;

(ඕ) පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම;

(ක) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම;

(ග) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය විය හැකි පරිදි කිසියම් ආකාරයක කම්ටුවක් හෝ කම්ටු පත් කිරීම;

(ච) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු වෙනත් කටයුතු කිරීම;

**2.1.1 අධිකාරියේ වියදම් සහ අරමුදල් ලැබීමේ මූලාශ්‍ර පහත දැක්වේ.**

| **වර්ෂය** | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
|---|---|---|---|---|---|
| | රු 000’ | රු 000’ | රු 000’ | රු 000’ | රු 000’ |
| **වියදම** | **519,030** | **551,938** | **561,698** | **538,606** | **554,550** |
| **අරමුදල් ලැබීමේ මූලාශ්‍ර** | | | | | |
| **-----------** | | | | | |
| **පුනරාවර්තන ප්‍රදාන** | 489,982 | 502,975 | 477,296 | 505,000 | 541,500 |
| **දඩ ආදායම්** | 32,910 | 39,094 | 21,826 | 13,570 | 37,141 |
| **වෙනත් ආදායම්** | 58,883 | 67,223 | 61,278 | 27,137 | 60,030 |
| **එකතුව** | **581,775** | **609,292** | **560,400** | **545,707** | **638,671** |

**2.2 විගණනය සඳහා අධිකාරී බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදි.

## 2.3 විගණන ප්‍රවේශය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 1977 ජංගම දුරකථන ප්‍රතිචාර සේවයට, දිස්ත්‍රික් කාර්යාල වලට හා ප්‍රධාන කාර්යාලයට පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි වැඩිවීම හා විසදීමේ ගැටළු පැවතිම, වෙළඳපොලේ නිතර ඇතිවන භාණ්ඩ මිල උච්චාවචනය සම්බන්ධ අධිකාරියේ මැදිහත් වීම පිළිබඳ ගැටළු, අධිකාරිය විසින් නිකුත් කරන ගැසට් පත්‍ර වල නියෝග හා විධාන පිළිබඳ අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ ගැටළු හා වෙළඳපොල පර්යේෂණ වාර්තා මඟින් ලබා ගන්නා තොරතුරු හා නිර්දේශයන් සම්බන්ධ ගැටළු හේතුවෙන් ගැටළු ප්‍රවේශයන් යටතේ විගණන ප්‍රවේශය සිදු කරන ලදී.

## 2.4 ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග ඇති සම්බන්ධතාවය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව, 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින්, යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම, සෑදීම, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ විකිණීම සහ යම් සේවා සැපයීම සම්බන්ධයෙන් නියම කරන ලද ප්‍රමිත සහ පිරිවිතර, අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන ලද ප්‍රමිති සහ පිරිවිතර වශයෙන් පිළිගනු ලැබිය හැකිය.

## 2.5 විගණන අරමුණ

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා සිදු කරන කාර්යභාරයේ කාර්යසාධනය ඇගයීම.

## 2.6 උප විගණන අරමුණු හා නිර්නායක

| | උප විගණන අරමුණු | නිර්නායක | මූලාශ්‍රය |
|---|---|---|---|
| **2.6.1** | පාරිභෝගික ආරක්ෂාව සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් නීති රීති සැකසි තිබේද යන්න ඇගයීම | • පාරිභෝගික ආරක්ෂාව සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් නීති රීති සැකසී තිබීම | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත |
| | | • නීති රීති කාලීනව සංශෝධනය වීමේ අවශ්‍යතාවයන් කළමනාකරණ විසින් හඳුනාගෙන තිබීම. | 2019 අගෝස්තු 16 දිනැති අංක CAA / L&E / 37/ 2019 දරන අධ්‍යක්ෂ මණ්ඩල තිරණය |

| | | | |
|---|---|---|---|
| **2.6.2** | පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් ආරක්ෂාව සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම | • භාණ්ඩ සෑදීම, ආනයනය කිරීම, අලෙවි කිරීම, ගබඩා කිරීම, විකිණීම හා රැස් කිරීම පිළිබඳ වෙනත් යම් කොන්දේසි නිශ්චිතව සඳහන් කෙරෙන විශේෂ විධාන යම් පන්තියකට අයත් සාදන්නන් හෝ වෙළඳුන් වෙත නිකුත් කර තිබීම | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ වගන්ති අංක 10(i) (ආ) (ii) |
| | | • භාණ්ඩ මිල ලකුණු කිරීම ලේබල් කිරීම හා ඇසිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් සාදන්නන්ට හෝ වෙළඳුන්ට විධාන නිකුත් කළ යුතු බව | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ වගන්ති අංක 10(i) (අ) |
| | | • නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල බව නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා වෙළඳපොල සාම්පල් ලබාගෙන තිබීම හා අවශ්‍ය පරීක්ෂාවන් සිදුකර තිබීම | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 හා 61 වගන්තිය |
| | | • තරග විරෝධී චර්යාවන් සම්බන්ධයෙන් වූ පැමිණිලි සම්බන්ධව කටයුතු කර තිබීම | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 34, 37 හා 41 වගන්තිය |
| | | • භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම සම්බන්ධයෙන් වන පැමිණිලි පිළිබඳව කටයුතු කර තිබීම | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 13 හා 32 වගන්තිය |
| | | • වෙළඳපොල තත්වය සහ පාරිභෝගික කටයුතු වලට අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සපයා තිබීම. | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 8 (ඌ) වගන්තිය |

| | |
|---|---|
| • පනතේ විධි විධාන හෝ නියෝගයන් අනුව නිසැකවම කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා වැටලීම් සිදුකර, නඩු පවරා දඩ මුදල් අය කර තිබීම. | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 58 වන වගන්තිය |
| • භාණ්ඩයක මිල, ප්‍රමිතිය හා පිරිවිතර, භාණ්ඩයක් සෑදීම, ආනයනය කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම, ලේබල් කිරීම සම්බන්ධයෙන් කොන්දේසි පිළිබඳව විධි විධාන සැලැස්වීම සඳහා අවශ්‍ය යැයි සලකන ලිඛිත ගිවිසුම් වලට එළඹ තිබීම | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 14 වන වගන්තිය |
| • යම් භාණ්ඩයක් තමා සන්තකයෙහි නොමැති බව කියා සිටීම හෝ යම් භාණ්ඩයක් කොන්දේසියකට යටත්ව විකිණීම නොකළ යුතු වීම | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 16 වන වගන්තිය |
| • වෙළඳුන් විසින් යම් භාණ්ඩයක් සාමාන්‍ය වෙළඳ අවශ්‍යතාවයන් ඉක්මවන ප්‍රමාණයකින් සගවා තබා රැස් කර තබා ගැනීම නොකළ යුතු වීම. | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 17 වන වගන්තිය |
| • සෑම වෙළෙන්දෙකුම අධිකාරියෙහි ලියාපදිංචි විය යුතු වීම. | 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 27 වන වගන්තිය |

## 2.7 විගණන විෂය පථය

පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම උදෙසා පාරිභෝගික සේවා අධිකාරිය විසින් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය තුළ උපරිම මිල සහතික නිකුත් කිරීම, භාණ්ඩවල ප්‍රමිත හා පිරිවිතර සම්බන්ධයෙන් කටයුතු කිරීම, සාම්පල ලබා ගැනීම, වෙළඳපොල වැටලීම් සිදුකිරීම හා නඩු පැවරීම් සහ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය හා වෙළඳපොල අධ්‍යනයන් පාරිභෝගිකයා දැනුවත් කිරීම සඳහා යොදාගෙන ඇති ආකාරය පිළිබඳව මෙම විගණනයේදී අවධානය යොමු කරන ලදී.

## 2.8 විගණන ක්‍රමවේදය

(අ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත හා ඊට අදාළව සිදුවිය යුතු සංශෝධනයන් අධ්‍යයනය කිරීම.

(ආ) අදාළ ගැසට් නිවේදන අධ්‍යයනය කිරීම

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරීක්ෂාව

(ඈ) පැමිණිලි වලට අදාළ ලිපිගොනු පරීක්ෂාව

(ඉ) වැටලීම් හා නඩු පැවරීම් වලට අදාළ තොරතුරු පරීක්ෂාව

(ඊ) අදාළ වෙනත් ලිපි ලේඛන පරීක්ෂාව

(උ) අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම

## 3. විස්තරාත්මක විගණන සොයාගැනීම්

### 3.1 ආයතනයට අදාල නෛතික පසුබිම ඇගයීම

#### 3.1.1 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීම

1979 අංක 01 දරන පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත,1987 අංක 01 දරන සාධාරණ වෙළඳ කොමිෂන් පනත,1950 මිල පාලන පනත යන පනත් තුන අහෝසි කරමින් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා තිබුණි. ඒ අනුව 1979 අංක 01 දරන පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත යටතේ නිකුත් කර තිබූ පොදු විධාන 62 ක්ද, අධිකාරී පනත යටතේ ද ක්‍රියාත්මක විය යුතු බව අධිකාරියේ පනතේ 73 වගන්තිය යටතේ දක්වා තිබුණි. එසේ වුවද, ඒවායේ වර්තමානයට ගැලපීම සම්බන්ධයෙන් පත් කල කමිටුව විසින් ඉන් විධාන 22 කට අදාල නව විධාන 14 ක් නිකුත් කිරීමට ද, විධාන 19 ක් සම්බන්ධයෙන් තවදුරටත් සලකා බැලීමෙන් අනතුරුව විධාන නිකුත් කිරීමට ද, විධාන 21 ක් අවලංගු කිරීමට ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2019 නොවැම්බර් 01 දින යෝජනා ඉදිරිපත් කර තිබුණ ද එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
(ඇමුණුම 1,2,3)

#### 3.1.2 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත සංශෝධනය කිරීම

2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ කීපයකදී පනතේ වගන්ති 30 ක් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ අතර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් සංශෝධන වගන්ති ඇතුළත් වාර්තාවක් 2022 ජූනි 23 දින වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය වන විට වසර 19 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි.

### 3.2 පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම

#### 3.2 .1 ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් උපරිම සිල්ලර මිල සහතික නිකුත් කිරීම

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ වගන්ති අංක 10(1) (ආ) (ii) වගන්ති ප්‍රකාරව අධිකාරිය විසින් පාරිභෝගිකයා ආරක්ෂා කරනු පිණිස භාණ්ඩ සෑදීම, ආනයනය කිරීම, අලෙවි කිරීම, ගබඩා කිරීම, විකිණීම හා රැස් කිරීම පිළිබඳ වෙනත් යම් කොන්දේසි නිශ්චිතව සඳහන් කෙරෙන විශේෂ විධාන යම් පන්තියකට අයත් සාදන්නන් හෝ වෙළඳුන් වෙත නිකුත් කරනු ලැබිය හැකිය.

ඒ අනුව 2007 ජූලි 11 දිනැති අංක 1505/11 ගැසට් නිවේදනයේ විධාන අංක 12 අනුව පනතේ 10(1) (ආ) (11) වගන්තිය යටතේ විධාන කරමින් පහත සංයෝජිත වර්ගීකරණ අංක (HS Code) මඟින් දැක්වෙන කලින් ඇසුරුම් කල භාණ්ඩ, අයිතමයන් හා නිෂ්පාදන සම්බන්ධ සියලුම ආනයනකරුවන්, සැපයුම්කරුවන්, නියෝජිතයන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් විසින් එම භාණ්ඩ හෝ නිෂ්පාදන දිවයිනට ඇතුළුවන ස්ථානයේදී එම භාණ්ඩ මත එම භාණ්ඩයට අදාල උපරිම සිල්ලර මිල, නිෂ්පාදකයාගේ, සැපයුම්කරුගේ, ආනයනකරුගේ හෝ බෙදාහරින්නාගේ නම හා ලියාපදිංචි ලිපිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු බව දක්වා තිබුණි.

| **ආහාර වර්ගය** | **HS කේතය** |
|---|---|
| --------------- | -------------- |
| රස කැවිලි (චුයින්ගම් ඇතුළුව) | HS Code 1704 |
| චොකලට් | HS Code 1806 |
| බිස්කට් | HS Code 1905 |
| කේක් | HS Code 1905 |
| සුවඳ සබන් | HS Code 3401 |

තවද, ශ්‍රී ලංකා රේගුව මඟින් 2008 ඔක්තෝම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි DOPL – 606B අංක දරණ උපරිම සිල්ලර මිල පදනම් වූ සෙස් බදු ගෙවිය යුතු ආනයන භාණ්ඩ පිළිබඳ මෙහෙයුම් උපදෙස් යනුවෙන් දෙපාර්තමේන්තු නියෝගයක් නිකුත් කර තිබුණි. ඒ අනුව,

i. රේගුව වෙත රේගු සටහන්කරය ඉදිරිපත් කිරීමට පෙර ලියාපදිංචිය සඳහා ආනයනකරු විසින් උපරිම සිල්ලර මිල ප්‍රකාශනය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

ii. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත සිය ලියකියවිලි ඉදිරිපත් කිරීමේදී ආනයනකරු විසින් අදාල භාණ්ඩවල උපරිම සිල්ලර මිල මුද්‍රණය කොට ඇත් ද යන වග ලිඛිතව අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

iii. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මිල ප්‍රකාශය ලියාපදිංචි කොට තමා වෙත පිටපතක් තබා ගනිමින් ලියාපදිංචි අංකයක් නිකුත් කළ යුතුය.

iv. රේගු සටහන්කරය භාරගනු ලබන දත්ත ඇතුලත් කිරීමේ නිලධාරියා උපරිම සිල්ලර මිල ප්‍රකාශනය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලියාපදිංචි කොට ඇති බව සනාථ කරගත යුතුය.

යන කරුණු එම නියෝගයේ අවධාරණය කර තිබුණි.

මේ සම්බන්ධ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපරිම සිල්ලර මිල ලකුණු කර තිබිය යුතු බවට වන විධානයක් 2006 ඔක්තෝම්බර් 13 දින විධාන අංක 08 න් නිකුත් කර තිබුණු අතර එහි භාණ්ඩ වර්ග 56 ක් ලැයිස්තුගත කර තිබුණ ද 2007 ජූලි 11 දින නිකුත් කරන ලද විධාන අංක 12 න් හා එම විධානය අවලංගු කරමින් 2022 නොවැම්බර් 01 දින නිකුත් කරන ලද විධාන අංක 87 න් ද උපලේඛනයේ ඇතුලත් කර තිබුණේ රස කැවිලි (චුයින්ගම් ඇතුළුව), චොකලට්, බිස්කට්, කේක්, සුවඳ සබන් යන භාණ්ඩ වර්ග 05 ක් සඳහා පමණි.

(ආ) ශ්‍රී ලංකා රේගුවේ දත්ත අනුව නූඩල්ස්, පැස්ටා, චීස් වැනි භාණ්ඩ වාර්ෂිකව විශාල වශයෙන් ආනයනය කරනු ලැබුව ද 2022 නොවැම්බර් 01 දින නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ එම භාණ්ඩ ඇතුලත් කර නොතිබීම හේතුවෙන් එම භාණ්ඩ මිල ලකුණු කිරීම සඳහා අධිකාරියට හැකියාවක් නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාව ආනයන කරනු ලබන භාණ්ඩ වර්ග ප්‍රමාණය වර්තමානය වන විට විශාල වශයෙන් වැඩි වී පාරිභෝගිකයින්ගේ පාරිභෝජන රටාව වෙනස් වී තිබුණ ද ඉහත උපරිම සිල්ලර මිල ලකුණු කර තිබිය යුතු බවට නව විධානයක් 2022 නොවැම්බර් 01 දින නිකුත් කර ඇතත් එම ගැසට් නිවේදනයේද ඉහත සඳහන් භාණ්ඩ වර්ග 05 පමණක් ඇතුලත් කර තිබුණි.

(ඈ) අධිකාරියේ  තරඟකාරි ප්‍රවර්ධනය අංශය මඟින් 2018 පෙබරවාරි 20 දින විධාන අංක 12 අදාලත්වය සම්බන්ධව සිදු කරන ලද අධ්‍යයනය පිළිබඳ වාර්තාවක් නිකුත් කර තිබුණු අතර එම අධ්‍යයනයේදී පහත කරුණු අනාවරණය කරගෙන තිබුණි.

i. උපරිම සිල්ලර මිල සම්බන්ධව විධාන අංක 12 අනුගමනය කරන ආනයනකරුවන් ප්‍රමාණය ඉතා කුඩා ප්‍රමාණයක් වන බව හඳුනා ගෙන තිබුණු අතර බොහෝ ආනයනකරුවන් රටට ගෙන්වනු ලබන භාණ්ඩ මත වන බදු ගෙවීම පැහැර හැරීමට උත්සහ දරන බව දක්වා තිබුණි.

ii. වෙළෙඳපොලේ පවතින බොහෝ ආනයනික භාණ්ඩ නියමිත ක්‍රමවේදයෙන් බැහැරව රේගුවෙන් නිදහස් කෙරෙන බව හෝ බෑග්වල ආනයනය කරන බව (Baggages) හෝ නියමිත ක්‍රමවේදයට ආනයනය කල ද රේගුවෙන් නිදහස් කල පසු වෙනස් කිරීම් වලට ලක් කරන බව නිරීක්ෂණය කර තිබුණි.

iii. ඒ අනුව විධාන අංක 12 හි සඳහන් කරුණු උපරිම සිල්ලර මිල සහතික කිරීම අනුගමනය නොකරන ආනයනකරුවන්ට සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගවලට යැමට තරම් ශක්තිමත් නොවන බවත්, උපරිම සිල්ලර මිල සහතික කිරීමෙන් තොරව වෙනත් ආකාරවලින් (Baggage) රටට ආනයනය කරන ලබන භාණ්ඩ වෙළඳපොලේ විකිණීමට පවතින බවත් එම අධ්‍යනයේදී හඳුනාගෙන තිබුණි.

එම අධ්‍යයනයේදි නිරික්ෂණය කර තිබුණු ඉහත කරුණු සම්බන්ධයෙන් ඒවා වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය වර්තමානය වන විට ද අපොහොසත් වී තිබුණි.

(ඉ) අධිකාරිය විසින් 2022 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතිය හරහා උපරිම සිල්ලර මිල සඳහා අනුමැතිය ලබාදීම් සිදු කර තිබුණි. එහිදි ආනයනකරුවන් විසින් සලකනු කරන ලද මිල ගණන් වෙළඳපොළේ වර්තමානයේ එම භාණ්ඩ විකිණෙන මිල ගණන්වලට වඩා බෙහෙවින් අඩු අගයක් බව අධිකාරිය විසින්ම එම පද්ධතියේ තොරතුරු වල දක්වා තිබුණි. එමෙන්ම 2022 නොවැම්බර් 10 දින කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල රසකැවිලි අලෙවිසැල් වල  අලෙවිය සඳහා තබා ඇති විධාන අංක 87 අදාල භාණ්ඩ වල මිල ගණන් පිළිබඳ විමර්ශනයක් සිදු කොට තිබුණු අතර ඒ අනුව ආනයනකරුවන් විසින් භාණ්ඩ මත සලකුණු කරනු ලබන මිල ගණන් වලට වඩා වැඩි මිලකට වෙළෙඳපොලේ එම භාණ්ඩ විකුණනු ලබන බවත්, ලේබල් සමාගම් හරහා ලකුණු කරන ලද ලේබල් ගලවා ඉවත් කර වෙනත් ලේබල් අලවා ඇති බවත් නිරීක්ෂණය කර තිබුණි.

### 3.2.2 ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල බව සහතික කිරීමේ කාර්යය සඳහා සාම්පල ලබා ගැනීම.

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 61(1)(අ) වගන්තිය ප්‍රකාරව විකුණනු ලබන යම් භාණ්ඩයක්, පනතේ 12 වන වගන්තිය යටතේ නියමකර ඇති ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවන බව විශ්වාස කිරීමට තරම් අධිකාරියට හේතු ඇති අවස්ථාවක අධිකාරිය විසින් ඒ භාණ්ඩයේ සාම්පලයක් ලබාගැනීම සිදු කල හැකි අතර 61(2) වගන්තිය ප්‍රකාරව 12 වගන්තිය යටතේ නියම කර ඇති ප්‍රමිති හා පිරිවිතරවලට ඒ භාණ්ඩය අනුකූල වන්නේ දැයි නිශ්චිය කිරීමේ කාර්යය සඳහා අනුමත රස පරීක්ෂකවරයෙකු වෙත සාම්පල ඉදිරිපත් කිරීම කළ හැකිය.

ඒ අනුව 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අධිකාරිය විසින් ලබාගත් සාම්පල සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| **වර්ෂය** | **පරීක්ෂා කරන ලද සාම්පල ගණන** | **අදාල පරීක්ෂා කිරීමේ සමඟ අනුකූල වූ සාම්පල** | **අදාල පරීක්ෂා කිරීම් සමඟ අනුකූල නොවූ සාම්පල** | **නීතිමය ක්‍රියාමාර්ග නිම නොවූ සාම්පල** |
|---|---|---|---|---|
| 2018 | 69 | 35 | 34 | |
| 2019 | 82 | 62 | 19 | 1 |
| 2020 | 298 | 125 | 170 | 3 |
| 2021 | 329 | 209 | 56 | 67 |
| 2022 | 113 | 51 | 31 | 31 |

මූලාශ්‍රය :- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වැටලීම් අංශය

(අ) සාම්පල පරීක්ෂා කිරීමේදී අහිතකර ප්‍රතිඵල ලද සාම්පල සම්බන්ධව ඉහත කාලය තුල නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී තිබුණු අවස්ථාවන් 60 ක් නිරීක්ෂණය විය. එම ප්‍රමාද කාලය මාස 03 සිට මාස 22 කාල පරාසයක පැවතුණි. (ඇමුණුම 04)

(ආ) පාරිභෝගිකයා ආරක්ෂා කිරිමේ හා විකුණනු ලබන භාණ්ඩ හෝ සපයනු ලබන සේවාවල තත්ත්වය සහතික කිරීමේ කාර්යය සඳහා යම් භාණ්ඩයක, නිෂ්පාදනය, සෑදිම, සැපයිම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා විකිණිම සහ යම් යම් සේවා සැපයීමට අදාල ප්‍රමිති හා පිරිවිතර ගැසට් පත්‍රයේ පල කරනු ලබන නිවේදනයක් මඟින් කලින් කල නිශ්චය කල හැකිය. ඒ අනුව නිකුත් කරන ලද විධාන 18 ක් දැනට වලංගුව පවතින අතර ඉන් භාණ්ඩ වර්ග 16 ක් පමණක් ආවරණය කෙරේ. ඒ අනුව වෙළඳපොලේ පවතින විවිධ වූ භාණ්ඩ වර්ග සම්බන්ධයෙන් පවතින ප්‍රමිත අනිවාර්ය කෙරෙමින් ගැසට් නිකුත් කිරීම සිදු කර නොතිබුණු අතර එය භාණ්ඩ වර්ග 16 කට පමණක් සීමා වී තිබුණි. (ඇමුණුම 05)

(ඇ) 2018 සිට 2022 දක්වා කාලය තුල භාණ්ඩ වර්ග 18 ක සාම්පල ලබාගැනීම් කල ද ඉහත ප්‍රමිති හා පිරිවිතර අනිවාර්ය කරන ලද භාණ්ඩ වර්ග 10 කට අදාලව සාම්පල පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.(ඇමුණුම 05)

**3.2.3 පාරිභෝගික කටයුතු සභාව**

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ iv වන කොටස මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පිහිටුවීම, සංයුතිය හා කර්තව්‍ය සම්බන්ධයෙන් විධිවිධාන සඳහන් කර තිබුණු අතර පනතේ 39 (2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කටයුතු සඳහා සාමාජිකයින් තිදෙනකු පත් කරයි. මෙම පනත යටතේ සභාව වෙත යොමු කරනු ලබන සියලුම ඉල්ලීම් කිරීම පනතේ 40(1) වගන්තියට අනුව සභාවේ කර්තව්‍ය වන අතර ඒ අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 18,19 සහ 37 වගන්ති ප්‍රකාරව ඇතැම් භාණ්ඩ වල සිල්ලර මිල හෝ තොග මිල වැඩි කිරීම, අධික මිලකට භාණ්ඩ විකිණීමේදී උපරිම මිල තිරණය කිරීම සහ තරඟ විරෝධි චර්යා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමේදි එම කාරණාවට අදාලව තවදුරටත් නිශ්චය කිරීමේ කටයුතු සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳව සභාව වෙත ඉදිරිපත් කෙරේ.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පනතේ 34 වන වගන්තිය යටතේ තරඟ විරෝධි චර්යාවන් සම්බන්ධයෙන් වූ පැමිණිල්ලක් අධිකාරිය වෙත යොමු කල හැකි අතර එම ඉල්ලීම මත තරඟ විරෝධි චර්යාවන් පැවතිම සම්බන්ධයෙන් විමර්ශනයක් අධිකාරියට කල හැකිය. 34 වන වගන්තිය යටතේ පැවැත් වූ විමර්ශනයක් නිම වූ පසු පනතේ 37 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් එම කාරණය නිශ්චය කිරීමේ කාර්යය සඳහා සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඉන් මාසයක් ඇතුලත ඒ සම්බන්ධයන් නිමයන් කරනු ලැබිය යුතු බවට පනතේ 41 (3) හි දැක්වේ. එසේ වුවද 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සභාවේ විමර්ශන කටයුතු සඳහා යොමු කරන ලද අවස්ථා 07 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අදාල කාලය ඇතුලත අවසන් කර නොතිබුණි. එහි ප්‍රමාද කාලය මාස 03 සිට සිට අවුරුදු 6 දක්වා විය. විස්තර පහත දැක්වේ.

| පැමිණිලි දිනය | පැමිණිලි අංකය | විමර්ශනය කල දිනය | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද කාලය |
| --- | --- | --- | --- |
| ------------- | ---------------------- | -------------- | ----------- |
| 2016/09/23 | CAA/CP/C20/2016 | 2016.12.06 | අවුරුදු 06 |
| | CAC/50/2016 | 2017.01.20 | |
| 2016/12/22 | CAA/CP/26/2017 | 2017.07.28 | අවුරුදු 05 |
| 2018/07/03 | CAC/55/2018 | - | අවුරුදු 04 |
| | CAA/CP/C15/2018 | | |
| 2018/10/30 | CAA/CP/C01/2018 | - | අවුරුදු 04 |
| | CAC/56/2018 | | |
| 2018/12/28 | CAA/CP/C15/2018 | 2022.04.06 | අවුරුදු 04 |
| | CAC/57/2018 | | |
| 2019/11/05 | CAA/CP/C05/2019 | 2022.11.02 | අවුරුදු 03 |
| 2022/06/15 | CAA/CP/06/C03/20/21 | - | මාස 03 |

පාරිභෝගික සභාවට ලැබුණු තරඟ විරෝධි චර්යා සම්බන්ධ පැමිණිලි මසක් ඇතුලත විසදිය යුතු බව පනතේ 41 (3) අනුව දන්වා ඇත. එසේ වුවද 2022 වර්ෂය වන විට සභාව අවසන් කර තිබුණු පැමිණිලි අතරින් ලිපිගොනු 03 ක් පරික්ෂා කිරිමේදි නිරීක්ෂණය වූයේ එම පැමිණිලි විභාග කිරීමට වසර 04 සිට 06 දක්වා දිගු කාලයක් ගතවීම හේතුවෙන් මේ අවස්ථාව වන විට එම පැමිණිල්ල පැමිණිලිකරුවන්ට විසඳා ගැනීමේ අවශ්‍යතාවයක් නොවූයෙන් පැමිණිලි අවසන් කර තිබුණු බවය.

විස්තර පහත දැක්වේ.

(i) CAC/50/2016 සහ CAA/CP/C20/2016 යන පැමිණිලි අංක යටතේ 2016 සැප්තැම්බර් 23 දින එක්තරා සමාගමක් විසින් පාරිභෝගිකයා නොමඟ යවන සුළු දැන්වීම ප්‍රචාරය කිරීම සම්බන්ධව තවත් සමාගමකට එරෙහිව පැමිණිලි කර තිබුණි. මෙම පැමිණිල්ල විභාග කිරීම අවස්ථා 2කදී සිදු කර තිබුණ ද , 2017 ජනවාරි 20 න් පසුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර වර්ෂ 6කින් පසුව 2022 නොවැම්බර් 02 දින අධිකාරිය විසින් ඒ සඳහා පැමිණිලිකරු නැවත කැඳවුම් කර තිබුණද පැමිණිලිකරු ඊට ප්‍රතිචාර දක්වා නොතිබීම හේතුවෙන් පැමිණිල්ලේ කටයුතු අවසන් කර තිබුණි.

(ii) CAC/55/2018 සහ CAA/CP/C15/2018 යන පැමිණිලි අංක යටතේ 2018 ජූලි 03 දින එක්තරා සමාගමක් විසින් කිරිපිටි දැන්වීමක් පාරිභෝගිකයා නොමඟ යවන සුළු බවට තවත් සමාගමකට එරෙහිව පැමිණිලි කර තිබුණි. වසර 04 ක් ගත වූ පසු 2022 අප්‍රේල් 06 දින පැමිණිල්ලේ කටයුතු අවසන් කර තිබුණි.

(iii) CAA/CP/26/2017 යන පැමිණිලි අංකය යටතේ 2016 දෙසැම්බර් 22 දින එක්තරා සමාගමක් විසින් තවත් සමාගම් දෙකකට එරෙහිව තම සන්නාමය අවභාවිතා කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කර තිබුණි. මෙම පැමිණිල්ලට 2017 ජූලි 28 දින කැඳවා තිබූ අතර ඉන්පසු 2022 නොවැම්බර් 02 දින පැමිණිල්ලේ කටයුතු අවසන් කර තිබුණි.

**3. 2.4 පැමිණිලි පරීක්ෂාව**

අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 13 වන සහ 32 වගන්ති වලින් බලය පැවරී ඇත. ඒ අනුව ඉහත වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වී නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇප සහතිකයකට සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල වන ලෙස භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශනය කල හැකිය.

(අ) පාරිභෝගික පැමිණිලි අංශය වෙත ලද පැමිණිලි නියැදියක් පරීක්ෂා කිරීමේදී එම පැමිණිලි විසඳීමට අධිකාරියට මාස 11 සිට මාස 34 ක කාල පරාසයක් ගත වී තිබුණද පැමිණිලිකරුට සහනයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය (ඇමුණුම 06)

(ආ) 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,888 කින් පැමිණිලි 296 ක් සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර පැමිණිලි 211 කට නියෝග නිකුත් කර තිබුණද ඉන් පැමිණිලි 33 කට අදාලව නියෝග අත්සන් කර නොතිබුණි.

(ඇ) වසා දමා තිබූ පැමිණිලි සම්බන්ධයෙන් සිදුකල නියැදි පරික්ෂාවේදි පහත කරුණු නිරීක්ෂණය විය.

**(i) ලිපිගොනු අංකය CAA/CCU/919/2021/803/DG - වතුර මෝටරය**

පැමිණිලිකරු විසින් 2020 දෙසැම්බර් 19 දින රු.18,500 කට වතුර මෝටරයක් මිලදී ගෙන මාස 06 ක් වැනි කෙටි කාලයකදී දෝෂ සහිත වීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් අධිකාරිය වෙත 2021 ජුලි 15 දින යොමුකර තිබුණි. මෙම පැමිණිලි විභාග කිරීමට වසර 1 ½ අධික කාලයක් ගත වි තිබුනත් 2022 අගෝස්තු 02 වන දින වන විටත් ඒ සඳහා පාරිභෝගිකයාට සහනයක් ලබා දීමට එකඟ වී නොතිබුණු අතර පැමිණිල්ල වසා දමා තිබුණි.

**(ii) ලිපිගොනු අංකය CAA/CCU/1379/2021/746/DG - දූරකථනය**

පැමිණිලිකරු විසින් 2021 මාර්තු 02 දින රු.233,000 කට දූරකථනයක් මිල දී ගෙන දූරකථනය 2021 දෙසැම්බර් 01 දින වන විට අක්‍රිය වී ඇත. වගකීම් කාලය තිබියදීත් දෝෂ සහිත වීම නිසා 2021 දෙසැම්බර් 01 දින අධිකාරියට පැමිණිලි කරන ලදි. මේ පිළිබඳ 2022 මාර්තු 23, අප්‍රේල් 06, ජූනි 27 හා සැප්තැම්බර් 08 දින අදාල පාරිභෝගිකයා අධිකාරියට කැඳවා සාකච්ඡා කර තිබුණ ද 2022 ඔක්තෝම්බර් 30 දින වන විට පාරිභෝගිකයාට සහනයක් ලබා දී නොතිබුණු අතර දෙසැම්බර් 3 දින පැමිණිල්ල වසා දමා තිබුණි.

**(iii) ලිපිගොනු අංකය CAA/L&E/INQ/052/2022**

පැමිණිලිකරු විසින් 2019 ජූනි 18 දින නව මාදිලියේ ජීප් රථයක් මිල දී ගෙන තිබුණු අතර එහි වගකීම් කාලය වසර 03 ක් විය. මාස 02 ක් ඇතුලත එහි කාර්මික දෝෂයක් ඇති වීම හේතුවෙන් මිල දී ගත් ආයතනය වන සීමාසහිත යුනිමෝ පුද්ගලික සමාගමට යොමු කර තිබුණි. වගකීම් කාලය තුළ සිදු කරනු ලබන අළුත්වැඩියා වෙනුවෙන් මුදල් අය නොකල යුතු වුවද අදාල අළුත්වැඩියාව වෙනුවෙන් මුදල් ගෙවන ලෙස සමාගම විසින් පැමිණිලිකරු වෙත දන්වා තිබුණි. ඒ හේතුවෙන් පැමිණිලිකරු විසින් 2021 නොවැම්බර් 02 දින අධිකාරියට මෙ සම්බන්ධයෙන් පැමිණිලි කර තිබුණු අතර 2022 ඔක්තෝම්බර් 02 දිනට පැමිණිල්ල ඉදිරිපත් කර වසරක් ඉක්ම ගොස් තිබුණද ඒ සඳහා විසඳුමක් ලබාදීමට අධිකාරිය අසමත් වී තිබුණි.

(ඇ) කෘෂිකාර්මික උපකරණ සඳහා ලැබී ඇති පැමිණිලි සම්බන්ධව අධිකාරි පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට ප්‍රතිපාදන සලසා නොමැති බැවින් පරික්ෂා කර නියෝග ලබා දීමට හෝ නීතිමය පියවර ගැනීමට හැකියාවක් නොතිබුණු බව ඊට අදාල පැමිණිලි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව ට්‍රැක්ටරයක් සහ ගොයම් කපන යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාලව යොමු කර තිබුණු පැමිණිලි දෙකක් සඳහා අධිකාරියට නීතිමය පියවර ගැනීමට නොහැකි වීමට හේතු ලෙස පහත අඩුපාඩු හඳුනා ගෙන තිබුණි.

(i) මෙරටට ආනයනය කරන කිසිදු කෘෂි යන්ත්‍රෝපකරණයක් සඳහා තිබිය යුතු අවම ප්‍රමිති මොනවාද යන්න නියමයන් අනිවාර්ය කර නොමැති වීම.

(ii) එම නිසා මෙරටට කෘෂි උපකරණ ආනයනය කරන ආයතන ඉතා කෙටි කාලයක් තුල වැසියාම හෝ වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ වීම නිසා අගතියටපත් වූ ගොවීන්ට වගකිව යුතු පාර්ශවය පිළිබඳ ගැටලු නිර්මාණය වී තිබීම.

මේ අනුව නියමිත ප්‍රමිතියක් හඳුනා නොගැනීම නිසා රට තුලට පැමිණෙන කෘෂි උපකරණ වල පහත ගැටලු පැන නැගී ඇති බව 2022 ඔක්තෝබර් 26 දින පාරිභෝගික අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලෙකම් වෙත යවන ලද වාර්තාවේ නිරීක්ෂණය විය.

- මෙරට භූමිය තුල නිසිලෙස ක්‍රියාත්මක කල නොහැකි යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීම.
- මෙම යන්ත්‍ර යල හා මහ කන්න වල පමණක් භාවිතා කරන ඒවා වුවත් වගකීම් කාලය ලබාදිමේදි සීමිත කාලයක් පමණක් භාවිතා කරන මෙම යන්ත්‍ර සඳහා පොදුවේ වසරක් හෝ 02 ක් ලබාදීම.
- මෙම යන්ත්‍ර වලට අදාල අමතර කොටස් දුලබ හා මිල අධික වීම.
- නඩත්තු හා අළුත්වැඩියාවන් දුර්වල මට්ටමක පැවතීම.
- තත්ත්වයෙන් බාල පාවිච්චි කරන ලද යන්ත්‍ර අළුත් ඒවා ලෙස පාරිභෝගිකයා නොමඟ යවා විකිණීම.

ඉහත කරුණු නිසා කෘෂි උපකරණ මිල දි ගත් පාරිභෝගිකයින් පහත අපහසුතාවලට ලක් වී තිබුණු බව යොමුකර තිබූ පැමිණිලි අනුව තහවුරු වුණි.

- වගකීම් කාලය අවසන් වීම.
- පාරිභෝගිකයන්ගේ නීති රීති පිළිබඳ දැනුම අල්ප වීම
- වෙළඳුන් හිතාමතාම පාරිභෝගිකයන් මඟ හැරීම
- තත්ත්වයෙන් බාල අමතර කොටස් සැපයීම

### 3.2.5 1977 - පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය

පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා 1977 දරන පාරිභෝගික සේවා විමසුම සවිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව Z messenger පෞද්ගලික සමාගම වෙත 2013 මාර්තු 14 දින පවරා තිබුණු අතර 2014 ජනවාරි 20 දින සිට වසර 5 ක කාලයක් බලාත්මක වන ලෙස ගිවිසුම් ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට ගිවිසුම්ගත මුදල රු.5,685,143 ක් වූ අතර ඒ සඳහා දැරූ වියදම රු.5,401,428 ක් විය. විස්තර පහත දැක්වේ.

| දිනය | වවුචර් අංකය | වටිනාකම(රු.) |
|---|---|---|
| 2013 ජූනි 20 | 1035 | 1,421,428 |
| 2014 ජනවාරි 23 | 02 | 2,274,285 |
| 2014 මැයි 29 | 09 | 1,705,715 |
| **එකතුව** | | **5,401,428** |

(ආ) මෙම ව්‍යාපෘතිය ජනතාව වෙත ප්‍රචාරණය කිරීම සඳහා Adcore Creative පෞද්ගලික සමාගම තෝරාගෙන තිබුණු අතර ඒ සඳහා රු.22,290,323 ක් වැය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය 2013 අප්‍රේල් 24 දින ලැබී තිබුණි. ඒ අනුව පහත වියදම් දරා තිබුණි.

| දිනය | වවුචර් අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|---|
| 2013 අගෝස්තු 28 | 09 | පුවත්පත් 09 ක දැන්වීම් පල කිරීම | 1,967,898 |
| 2013 මාර්තු 14 | 451 | රූපවාහිනි දැන්වීම් සඳහා අත්තිකාරම් | 1,819,044 |
| | **එකතුව** | | **3,786,942** |

(ඇ) මෙම ව්‍යාපෘතියේ අරමුණු වූයේ ගොවියාට හා පාරිභෝගිකයාට වෙළඳපොල මිල Interactive Voice Recording මඟින් ලබා දීමයි. ඒ අනුව පාරිභෝගික ජනතාවට පහත සඳහන් ක්‍රම මඟින් තොරතුරු ලබා දීමට අදහස් කර තිබුණි.

- SMS මඟින් තෝරාගත් භාණ්ඩවල මිල ගණන්
- කාල අන්තර සඳහා මිල ලේඛන යාවත්කාලීන කිරීම
- පාරිභෝගික අධ්‍යාපන ඉඟි
- ප්‍රවෘත්ති

පාරිභෝගිකයාට ද පහත සඳහන් සේවාවන් ලබා දීමට අරමුණු කර තිබුණි.

- මිල ලේඛණ
    - අත්‍යවශ්‍ය ආහාර
    - එළවළු
    - මාළු හා මස්
- විශේෂ පුවත්
- ප්‍රවෘත්ති
- අධ්‍යාපන ඉඟි
- Smart පාරිභෝගික Alerts

මීට අමතරව සමාජ මාධ්‍ය මඟින් පැමිණිලි කිරිම් ද Auto mated Wall Post හා ආර්ථික මධ්‍යස්ථානවල LED Displayers සකස් කිරීමට ද යෝජිතව තිබුණි.

(ඈ) පාරිභෝගිකයන්ට සිදුවන අසාධාරණකම් පිළිබඳ පැමිණිලි කිරීමට පාරිභෝගික සේවා විමසුම සවි කිරීමේ ව්‍යාපෘතිය මගින් හඳුන්වා දුන් Complaint Management System යටතේ පහත කාර්යයන් කිරීමට යෝජිතව තිබුණි.

- පාරිභෝගික (SMS)
    - පැමිණිලි යැවීම
    - පසුවිපරම් ලැබීම

මෙම පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය සඳහා පිරිවැය වශයෙන් රු.5,401,428 ක් හා එය මහජනයා අතර ප්‍රචාරණය කිරීම සඳහා රු.3,786,942 ක වියදමක් දරා තිබුණ ද එම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද පහත සඳහන් කාර්යයන් ඉටු වී නොතිබුණි.

(i) සහන අපේක්ෂාවෙන් පාරිභෝගික ජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට විධිමත් දත්ත පද්ධතියක් හා ඊට සම්බන්ධ කළ හැකි දුරකථන පද්ධතියක් පැවතිම තුල පෙර සඳහන් කල ආකාරයට පැමිණිලිකරු වෙත කෙටි පණිවිඩයක්, මාර්ගගත පැමිණිල්ලේ අංකය හා විමර්ශනයේ ප්‍රගතිය දැනුම්දීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ii) සියලු දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධ කිරීමෙන් දත්ත ඇතුලත් කිරීමට හැකි වන පරිදි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි

### 3.2.6 වෙළඳපොල අධ්‍යයන පිළිබඳ පරීක්ෂාව

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 8 (ඌ) වගන්තිය අනුව වෙළඳපොල තත්ත්ව සහ පාරිභෝගික කටයුතු වලට අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම අධිකාරියේ එක් කර්තව්‍යක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 2021 වර්ෂයේදී කාබනික කෘෂිකර්ම හා කාබනික නිෂ්පාදන සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ හා වෙළඳපොලෙහි අලෙවි වන විවිධ අත් සේදුම් දියර වර්ග වල අන්තර්ගත ඇල්කොහොල් ප්‍රතිශතය පිළිබඳව සිදුකරන ලද වෙළඳපොල අධ්‍යයන 2 ක් සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව තහවුරු නොවීය.

වෙළඳපොල අධ්‍යයන 2 හි අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කාබනික පොහොර පිළිබඳ අනාවරණය වූ කරුණු.

(i) වෙළඳපොල නියමාකාර විමර්ශනයක් රහිතව ක්‍රියාත්මක වන බවත්

(ii) ඒ තුලින් ව්‍යාජ කාබනික නිෂ්පාදන වෙළඳපොල තුල පැවතීම තුලින් පාරිභෝගිකයා රැවටෙන බවත්

(iii) කාබනික නිෂ්පාදන මිල ගණන් අනෙකුත් සාමාන්‍ය නිෂ්පාදන වල මිල ගණන් වලට වඩා ඉතා වැඩි බවත්

(iv) ඒ අනුව කාබනික නිෂ්පාදන පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම හා කාබනික නිෂ්පාදන සම්බන්ධව පාරිභෝගික විශ්වාසය වැඩි කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මැදිහත් විය යුතු බවත් හඳුනාගෙන තිබුන ද ඒ සඳහා අවධානය යොමු කරමින් පාරිභෝගිකයා දැනුවත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) අත්සේදුම් දියර වලදී අනාවරණය වූ කරුණු

(i) පවතින අත්සේදුම් දියර බොහොමයක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොමැති බවත්

(ii) රසායනික ද්‍රව්‍ය යොදා ගනිමින් අඩු පිරිවැයකින් ඇල්කොහොල් නිෂ්පාදනය කරන අතර එම ඇල්කොහොල් යොදා ගනිමින් ගුණත්වයෙන් අඩු අත් සේදුම් දියර නිපදවා වෙළඳපොලට ඉදිරිපත් කරන බවත්

(iii) මෙම ප්‍රමිතියෙන් තොර අත්සේදුම් දියර භාවිතය තුලින් පාරිභෝගිකයන් රෝගාබාධ වලට ගොදුරු වීමේ අවධානමක් ඇති බවත් නිරීක්ෂණය කර තිබුණු අතර නියමිත ගුණත්වය හා ප්‍රමිතිය පවත්වා ගැනීමට නොහැකි වන අත්සේදුම් දියර වර්ග වලට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්

(iv)විවිධ මිල ගණන් යටතේ සේදුම් දියර වෙළඳපොලේ අළෙවි වන බැවින් මිල පාලනය සඳහා පියවර ගැනීමටත්

(v) වර්තමානයේ වෙළඳපොලට නව අත්සේදුම් දියර වර්ග බොහොමයක් පැමිණෙන බැවින් ඒවා අහඹු පරීක්ෂාවට ලක් කිරීමටත්ය.

### 3.2.7 වැටලීම් කටයුතුවල ප්‍රගතිය

අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය නිලධාරි සංයුතිය තිරණය කිරිමේදී දිස්ත්‍රික්කයේ ජනගහනය හා පවතින ඉඩ කඩ ප්‍රමාණය පදනම්ව සියළු දිස්ත්‍රික් කාර්යාල A සිට E දක්වා වර්ගීකරණය කර ඇත. ඒ මත පදනම්ව එක් එක් දිස්ත්‍රික්ක සඳහා වැටලීම් ඉලක්ක සකස් කර තිබුණි

(අ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 2018 වර්ෂයේ සිට 2022 වර්ෂයේ දක්වා කාලයට අදාලව එක් එක් දිස්ත්‍රික්ක සඳහා වැටලීම් ඉලක්ක හා සත්‍ය වශයෙන් සිදු කරන ලද වැටලීම් ප්‍රමාණය පහත දැක්වේ.

| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| ඉලක්කගත වැටලීම් | 31680 | 31680 | 26004 | 27300 | 24,936 |
| සත්‍ය වැටලීම් | 23532 | 24061 | 15923 | 9494 | 13,980 |
| ළඟාවිමේ ප්‍රතිශතය % | 74 | 76 | 61 | 35 | 56 |

මූලාශ්‍රය -:පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශය- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

මෙ අනුව 2018 වර්ෂයේදි වැටලීම් ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය සියයට74 ක් වුවද 2021 වර්ෂය වන විට එය සියයට 35 ක් දක්වා අඩු වී තිබුනු අතර 2022 වර්ෂයේ වැටලීම් සිදු කිරිමේ ප්‍රගතිය සියයට 56 ක් බව නිරික්ෂණය වේ.

(ආ) 2022 වර්ෂයේ එක් එක් දිස්ත්‍රික්කවල වැටලීම් ඉලක්ක ලඟාකර ගැනිමේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරිමේදී දිස්ත්‍රික්ක 8 ක ප්‍රගතිය සියයට 52 ට වඩා අඩු මට්ටමක පවතින බව නිරික්ෂණය විය.

විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක කාණ්ඩය | ඉලක්කගත වැටලීම් (මුල් මාස 06) | සත්‍ය වැටලීම් | ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රතිශතය % | අනුයුක්ත කර සිටි නිලධාරීන්ගෙන් (හිඟ)/අතිරික්ත නිලධාරින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කොළඹ | A | 1656 | 713 | 43 | (9) |
| ගම්පහ | A | 1656 | 857 | 52 | 1 |
| මහනුවර | A | 1656 | 712 | 43 | 4 |
| කළුතර | B | 972 | 260 | 27 | (4) |
| ගාල්ල | B | 972 | 440 | 45 | (8) |
| බදුල්ල | B | 972 | 415 | 43 | (6) |
| නුවරඑළිය | C | 828 | 364 | 44 | (4) |
| මොණරාගල | D | 672 | 344 | 51 | (1) |

(ඇ) ඉහත වැටලීම් ප්‍රගතිය සියයට 52 කට වඩා අඩු දිස්ත්‍රික්ක වලින් දිස්ත්‍රික්ක 02 ක නිලධාරින් 05ක ප්‍රමාණයක අතිරික්තයක් පැවතුණි.

(ඈ) එක් එක් දිස්ත්‍රික්කයන්ට අවශ්‍ය විමර්ශන නිලධාරීන් හා විමර්ශන නිලධාරින් අනුයුක්ත කර තිබුණු සංඛ්‍යාව සංසන්දනය කිරිමේදී 2022 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික්ක 9 ක විමර්ශන නිලධාරීන් 23 ක් අතිරික්තව ද දිස්ත්‍රික්ක 12 ක විමර්ශන නිලධාරින් 47 ක් අඩුවෙන් ද අනුයුක්ත කර තිබුණි. මේ අනුව අධිකාරිය විසින් තම විමර්ශන නිලධාරින් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. (ඇමුණුම 07)

(ඉ) 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිදු කරන ලද වැටලීම් හා නඩු පැවරීම් තොරතුරු අනුව වැටලීම් 3715 න් වැටලීම් 3616 ක් එනම් සියයට 97ක් සම්බන්ධයෙන් නඩු පැවරීම් සිදු කිරීමට වර්ෂ 2කට අධික කාලයක් ගතවී තිබුණි.

| වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 ජූනි 30 දක්වා | එකතුව |
|---|---|---|---|---|---|---|
| වැටලීම් | 23,532 | 24,061 | 15,923 | 9,494 | 5,279 | 78,289 |
| නඩු පැවරීම් | 22,519 | 22,475 | 14,906 | 9,395 | 5,386 | 74,681 |
| නඩු පැවරීම් සිදු නොකල වැටලීම් | 1,013 | 1,586 | 1,017 | 99 | (107) | 3,608 |

(සටහන: 2018, 2019, 2020 සඳහා නඩු පැවරීම් සිදු නොකල වැටලීම් සංඛ්‍යාව 3616 ක් විය)

(ඊ) 2022 ඔක්තෝබර් 31 දින වන විට පනතේ වගන්ති අංක 10 හා 12 යටතේ නිකුත් කර ඇති විධානවලින් විධාන 48 ක් වලංගුව තිබුණ ද එක් එක් විධානයට අදාලව කොපමණ වැටලීම් සංඛ්‍යාවක් සිදු කලේද යන්න පිළිබඳ දත්ත පද්ධතිය මඟින් තොරතුරු ලබාගැනීමේ හැකියාවක් නොතිබුණි.

### 3.2.8 වෙළඳාම විධිමත් කිරීම

#### (අ) වගන්ති අංක 09

වෙළඳාම විධිමත් කිරීම සම්බන්ධව පනතේ වගන්ති අංක 9 (අ) ප්‍රකාරව භාණ්ඩ හා සේවා සතුටුදායක තත්ත්වයකට ද සාධාරණ මිලකට ද සෑහෙන ප්‍රමාණයකට ද පාරිභෝගිකයාට ලබාගත හැකි වන බවට සහතික වන පරිදි විකිණීම හෝ සැපයීම සම්බන්ධයෙන් අධ්‍යයන කිරීම භාර ගැනීම හා 9 (ආ) ප්‍රකාරව එම කාර්යය සඳහා පාරිභෝගික සංවිධාන ප්‍රවර්ධනය කිරීම හා ඒවාට සහය දීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ලෙස දක්වා තිබුණ ද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

#### (ආ) වගන්ති අංක 10

පනතේ වගන්ති අංක 10 යටතේ භාණ්ඩ මිල ලකුණු කිරීම, ලේබල් කිරීම හා ඇසිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් සාදන්නන්ට හෝ වෙළෙඳුන්ට විධාන නිකුත් කල යුතු බව දක්වා තිබේ.

ඒ අනුව පනතේ වගන්ති අංක 10 (1) (අ) හා 10 (1) (ආ) (ii) යටතේ පාරිභෝගිකයා ආරක්ෂා කරනු පිණිස නිකුත් කරන ලද විධාන ඇතුලත් ගැසට් නිවේදන 29 ක් දැනට වලංගුව පවතින අතර ඒ පිළිබඳ විස්තර ඇමුණුම 08 හි දැක්වේ.

වගන්ති අංක 10 යටතේ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාලව සිදු කරන ලද වැටලීම් පහත පරිදි වේ.

| | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **එකතුව** |
|---|---|---|---|---|---|---|
| වගන්ති අංක 10 | 10172 | 9313 | 5381 | 2822 | 5963 | 33651 |

(i) 2022 වර්ෂයට අදාලව පනතේ වගන්ති අංක 10 යටතේ සිදු කරන ලද වැටලීම් එක් එක් වලංගු විධාන උල්ලංඝනයවීම් වලට අදාලව වෙන් වෙන් වශයෙන් ලබා දී තිබුණි.ඒ අනුව වලංගු විධාන 5 ක් සම්බන්ධව (විධාන අංක 32,58, 79,80, 81) 2022 වර්ෂයේදි කිසිදු දිස්ත්‍රික්කයක කිසිදු වැටලීමක් සිදු කර නොතිබුණි. (ඇමුණුම 09)

(ii) 2022 වර්ෂයට අදාලව වැටලීම් විස්තර අනුව පනතේ වගන්ති අංක 10 යටතේ නිකුත් කරන ලද විධාන 18 කට අදාලව (විධාන අංක: 27, 39, 42, 45, 51, 54, 55, 57, 60, 61, 62, 69, 75, 77, 78, 83, 84, 86) වැටලීම් සංඛ්‍යාව 50 කට අඩු ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. (ඇමුණුම 09)

**(ඇ) වගන්ති අංක 12**

පනතේ වගන්ති අංක 12 යටතේ භාණ්ඩවලට සහ සේවා සැපයීමට අදාල ප්‍රමිති සහ පිරිවිතර නිශ්චය කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නියම කරන ලද ප්‍රමිති හා පිරිවිතර අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන නිවේදනයක් මඟින් තිබිය යුතු බවට විධාන නිකුත් කරනු ලැබේ.ඒ අනුව පනතේ 12(1) හා 12(2) වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන 18 ක් මේ වන විට වලංගුව පවති. (ඇමුණුම 5)
වගන්ති අංක 12 යටතේ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාලව සිදු කරන ලද වැටලීම් පහත පරිදි වේ.

| | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **එකතුව** |
|---|---|---|---|---|---|---|
| වගන්ති අංක 12 | 177 | 739 | 259 | 132 | 219 | 1526 |

2022 වර්ෂයට අදාලව වැටලීම් විස්තර අනුව පනතේ වගන්ති අංක 12 යටතේ නිකුත් කරන ලද විධාන 19 න් විධාන 07 කට අදාලව වැටලීම් සිදු කර නොතිබුණු අතර ආරක්ෂිත හිස්වැසුම් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය ලෙස විධාන අංක 59 න් වැටලීම් 37 ක් සිදු කර තිබුණි. විධාන 7 කට අදාලව වැටලීම් සිදු කර නොතිබුණි. (ඇමුණුම 10)

**(ඈ) වගන්ති අංක 14**

වගන්ති අංක 14 යටතේ අධිකාරිය විසින් වෙළෙන්දන් සමඟ භාණ්ඩයක මිල,ප්‍රමිතිය හා පිරිවිතර, භාණ්ඩයක් සැදිම ආනයනය කිරීම, බෙදාහැරීම ප්‍රවාහනය කිරීම, ලේබල් කිරීම

සම්බන්ධයෙන් කොන්දේසි පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා අවශ්‍ය යැයි සලකන ලිඛිත ගිවිසුම්වලට එළඹිය හැකිය.

මෙම වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් කිරිපිටි මිල සම්බන්ධව 2019 ජනවාරි 07 සිට වර්ෂයකට වලංගුවන පරිදි ෆොන්ටෙරා බ්‍රෑන්ඩ්ස් ලංකා පෞද්ගලික සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණ ද, කල් ඉකුත් වීමෙන් පසුව එම ගිවිසුම නැවත වලංගු කිරීමක් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් වෙළෙන්දන් සමඟ භාණ්ඩයක මිල,ප්‍රමිතිය හා පිරිවිතර, භාණ්ඩයක් සෑදීම ආනයනය කිරීම, බෙදාහැරීම ප්‍රවාහනය කිරීම, ලේබල් කිරීම සම්බන්ධයෙන් කොන්දේසි පිළිබඳව විධිවිධාන සැලැස්වීම සම්බන්ධයෙන් වෙළෙන්දන් සමඟ එකගතාවයකට පැමිණීම සහ ඒ සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේදී ගැටලුකාරී තත්වයන් ඇතිවිය හැකිය.

**(ඉ) වගන්ති අංක 16**

වගන්ති අංක 16 යටතේ වෙළෙඳාම් කිරීම් කාර්ය සඳහා ඇති යම් භාණ්ඩයක් තම සන්තකයෙහි නොමැති බව කියා සිටීම හෝ යම් භාණ්ඩයක් කොන්දේසියකට යටත්ව විකිණීම හෝ වරදක් බව දක්වා ඇත.

වගන්ති අංක 16 යටතේ 2018 සිට 2022 වර්ෂයට අදාල කාලය තුල සිදු කරන ලද වැටලීම් විස්තර පහත දැක්වේ.

| | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
|---|---|---|---|---|---|
| වගන්ති අංක 16 | 12 | 24 | 32 | 56 | 176 |

වගන්ති අංක 16 ට අදාලව 2022 වර්ෂයේදී සිදුකරන ලද වැටලීම් 176 හි තොරතුරු දිස්ත්‍රික්ක හා භාණ්ඩ වර්ග අනුව ඇමුණුම අංක 11 හි දැක්වේ.

(i) ඒ අනුව කිරිපිටි, සිමෙන්ති, සහල් හා බිත්තර තම සන්තකයේ නොමැති වීම සම්බන්ධව 2022 වර්ෂයේදී පිළිවෙලින් වැටලීම් 29, 48, 24 ක් හා 16 ක් සිදු කර තිබුණි. කිරිපිටි සම්බන්ධයෙන් නඩු පැවරීම් 29 ක් මගින් රු 160,000 ක දඩ මුදලක්ද, සිමෙන්ති සම්බන්ධයෙන් නඩු පැවරීම් 39 ක් මගින් රු 250,000 ක දඩ මුදලක්ද, සහල් සම්බන්ධයෙන් නඩු පැවරීම් 23 ක් මගින් රු 146,500 ක දඩ

මුදලක්ද, බිත්තර සම්බන්ධයෙන් නඩු පැවරීම් 14 ක් මගින් රු 72,000 ක දඩ මුදලක්ද අය කරගෙන තිබුණි.

(ii) එසේ වුවද දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 12 ක කිරිපිටි හා සිමෙන්ති සම්බන්ධව ද, දිස්ත්‍රික්ක 16 ක හාල් සම්බන්ධවද, දිස්ත්‍රික්ක 18 ක බිත්තර සම්බන්ධව ද වගන්ති අංක 16 යටතේ වැටලීම් සිදුකර නොතිබුණි.

**(ඊ) වගන්ති අංක 17**

මෙම වගන්තිය යටතේ කිසියම් වෙළෙන්දකු විසින් යම් භාණ්ඩයක් සාමාන්‍ය වෙළඳ අවශ්‍යතාවන් ඉක්මවන ප්‍රමාණයකින් සඟවා තබා රැස්කර තබා ගැනීම නොකල යුතු බව දක්වා තිබේ.

විධාන අංක 79,80 හා 81 යටතේ වී/සහල්, සීනි, කිරිපිටි හා බඩ ඉරිඟු නිෂ්පාදකයන්,රැස් කරන්නන්, ගබඩාකරුවන්, බෙදාහරින්නන් හා තොග වෙළෙන්දන් තමා යටතේ පවතින ගුදම්, ගබඩා බහාලුම් හෝ වෙනත් ස්ථාන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලියාපදිංචි කල යුතු බවට 2021 ජූනි 11 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍ර මඟින් විධානය කර තිබුණි. එමෙන්ම එම ස්ථානවල පවතින තොග පිළිබඳව ද තොරතුරු අධිකාරිය වෙත ලබා දිය යුතු බවට ද එම විධානයේ දක්වා තිබුණි.

(i) ඒ අනුව ඉහත විධාන අංක 79,80,81 යටතේ 2021 ජූනි 11 සිට 2022 දක්වා කාලය තුල අධිකාරියේ ලියාපදිංචි වූ වෙළෙන්දන් (ගබඩා) සංඛ්‍යාව 1725 ක් විය.

(ii) සියලුම වී/සහල්, සීනි කිරිපිටි, බඩ ඉරිඟු නිෂ්පාදකයන්, රැස් කරන්නන් හා ගබඩා මේ යටතේ ලියාපදිංචි වී තම තොරතුරු අධිකාරිය වෙත ඉදිරිපත් කලේ ද යන්න සම්බන්ධයෙන් 2022 වර්ෂයේදි කිසිදු වැටලීමක් සිදු කර නොතිබුණි.

(iii) මෙම විධාන අනුව ඉහත භාණ්ඩ වර්ග වලට අදාලව තොග සම්බන්ධව යාවත්කාලින තොරතුරු අධිකාරිය විසින් පවත්වා ගෙන නොතිබුණි.

**(උ) වගන්ති අංක 27**

වගන්ති අංක 27 අනුව අමාත්‍යවරයා විසින් තිරණය කරනු ලබන රුපියල් ලක්ෂයක් නොඉක්මවන වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත සෑම වෙළෙන්දකුම අධිකාරයෙහි ලියාපදිංචි විය යුතු බවට දක්වා තිබුණ ද අධිකාරිය විසින් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## (ඌ) වගන්ති අංක 34

යම් තැනැත්තකු හෝ යම් පාරිභෝගික සංවිධානයක හෝ යම් වෙළඳ සංගමයක් විසින් අධිකාරිය වෙත කරන ලද පැමිණිල්ලක් මත, තරඟ විරෝධි චර්යාවන් පැවතිම සම්බන්ධයෙන් විමර්ශනයක් කළ හැකිය.

ඒ අනුව 2020, 2021 හා 2022 වර්ෂවල තරඟ විරෝධි චර්යා සම්බන්ධ ලද පැමිණිලි විස්තර පහත දැක්වේ.

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| පෙර වර්ෂයේ ඉකුත් කරන ලද පැමිණිලි | 17 | 28 | 24 |
| ලද පැමිණිලි | 23 | 21 | 23 |
| විසඳුම් ලබා දුන් | 12 | 24 | 33 |
| පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවට යොමු කිරීම | - | 1 | 1 |
| වර්ෂය අවසන් වන විට කටයුතු කලයුතු පැමිණිලි සංඛ්‍යාව | 28 | 24 | 13 |

තරඟ විරෝධි චර්යා සම්බන්ධව 2021 වර්ෂයේ ලද පැමිණිලි 05 ක් හා 2022 වර්ෂයේ ලද පැමිණිලි 08 ක් වශයෙන් පැමිණිලි 13 ක කටයුතු තවදුරටත් විමර්ශනය කෙරෙමින් පවතී.

## 4. නිර්දේශ

(i) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 73 වගන්තිය ප්‍රකාරව, ඉවත් කරනු ලැබූ 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂා කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද විධානවල කාලීන අවශ්‍යතාවය හඳුනාගෙන එම විධාන වර්තමානයට ගැලපීම උදෙසා පත් කල කමිටුව ඉදිරිපත් කර තිබුණු යෝජනා සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම

(ii) කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීම

(iii) ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් තවදුරටත් උපරිම සිල්ලර මිල සහතික නිකුත් කිරීමට අවශ්‍ය වන භාණ්ඩ වර්ග හඳුනාගෙන වර්තමානයට ගැලපෙන ආකාරයට එම භාණ්ඩ වර්ග ද ඇතුලත් කරමින් පුළුල් ආවරණයක් වන පරිදි නව විධාන පැනවීම.

(iv) ඉහත සඳහන් දත්ත පදනම් කර ගෙන අසාමාන්‍ය ලාභ උපයමින් පාරිභෝගිකයින් සූරාකන අවස්ථා හා වෙළඳුන් හඳුනාගැනීම, ඔවුන්ට එරෙහිව පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව වහාම කටයුතු කිරීම.

(v) පාලන මිලක් පැනවීම සඳහා නිර්දේශ කිරීමේදී ඒ සඳහා වෙළඳපොල මිල ගණන් හා පිරිවැය සැලකිල්ලට ගෙන තාත්ත්වික මිලක් නිර්දේශ කිරීම.

(vi) පාලන මිල ඉක්මවා අලෙවි කරන වෙළඳුන් සම්බන්ධයෙන් වන වැටලීම් පුළුල් කිරීම හා ආනයනකරුවන් හා තොග වෙළඳුන් සම්බන්ධයෙන් වන වැටලීම් පුළුල් කිරීම.

(vii) රේගු සටහන්කරය හා ඉන්වොයිසි මිල ගණන් සැලකිල්ලට ගැනීම හා ආනයනකරුවන් හා තොග වෙළඳුන් විකුණන ලද තොග ප්‍රමාණයන් හා මිල ගණන් පිළිබඳ දත්ත පවත්වාගෙන යාම.

(viii) උපරිම සිල්ලර මිල සහතික ලබා ගැනීමට අධිකාරියට තොරතුරු ඉදිරිපත් නොකරන ආනයනකරුවන් සම්බන්ධව වෙළෙඳපොල වැටලීම් කිරීම හා ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම

(ix) ආනයනකරුවන් විසින් උපරිම සිල්ලර මිල සහතික ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සඳහා අනුමැතිය ලබා දීමට පෙර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් එම මිල ගණන් සම්බන්ධව භෞතිකව පරීක්ෂා කිරීම

(x) පැමිණිලි අංශයට ලැබෙන පැමිණිලි අතරින් අධිකාරියට විසඳිය නොහැකි පැමිණිලි අදාල ආයතන වලට යොමුකල පසුව එම පැමිණිලි මඟින් පාරිභෝගිකයාට ඇති ගැටලුව විසඳී ඇද්ද යන්න පසු විපරම් කිරීම

(xi) පැමිණිලි අංශයෙන් විසඳීමට නොහැකි පැමිණිලි නීති අශයට යොමු කර එම පැමිණිලි කෙටි කාලයකින් විසඳා පරිභෝගිකයාට සහන සැලසීමට පියවර ගැනීම

(xii) කෘෂි උපකරණ සම්බන්ධ ලැබෙන පැමිණිලි විසදීමට පනතේ නීතිරීති ඇතුලත් කිරීම

(xiii) ප්‍රමිති ආයතනය සමඟ එකඟ වී ආනයනය කරන යන්ත්‍ර සූත්‍ර වල අදාල ප්‍රමිතියන් නියමයන් නියම කිරීම

(xiv) පනත ප්‍රකාරව වෙළෙන්දන් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කල යුතු අතර. ඒ සඳහා ක්‍රමවත් දත්ත පද්ධතියක් ඇති කිරීම

(xv) සාම්පල් පරීක්ෂා කිරිමේදි පාරිභෝජනයට නුසුදුසු බවට හෝ නියමිත ප්‍රමිතිය නොමැති බවට තහවුරු වන සාම්පල් සම්බන්ධව එම වෙළෙන්දුන්ට හා නිෂ්පාදකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම

(xvi) වෙළඳපල මිල ගණන් පාරිභෝගිකයාට දැන ගැනීමට හැකිවන ආකාරයට 1977 සේවාව සකස් කිරීම.

(xvii) 1977 මඟින් කරන පැමිණිලි සටහන් වූ බව පැමිණිලිකරුට නැවත දැන්වීමට ක්‍රමවේදයක් ඇති කිරීම

(xviii) දත්ත පද්ධතියේ තොරතුරු ඇතුලත් කිරිමේදී සෑම දිස්ත්‍රික්කයකම එකම ආකාරයෙන් තොරතුරු ඇතුලත් කිරීම

(xix) විධාන අංක අනුව කරන වැටලීම් පිළිබඳව වෙන වෙනම දත්ත ලබාගත හැකි පරිදි තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම

(xx) වැටලීම් වලදී නඩු මඟින් දඩ අයකිරිමේදී එම අයකරන දඩ මුදල අදාල නඩුවට අයකර තිබේද යන්න හඳුනා ගත හැකි පරිදි දත්ත පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීමට ක්‍රමවේදයක් ඇති කිරීම.

(xxi) වැටලීම් සිදු කර, නඩු පැවරීම් සිදු නොකල වැටලීම් සම්බන්ධයෙන් නඩු පැවරීම් නොකිරීමට හේතු වන කරුණු සම්බන්ධව අධීක්ෂණය සිදු කිරීම.

(xxii) පනතේ විවිධ වගන්ති යටතේ මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ කරුණු සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම

(xxiii) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත ප්‍රකාරව පැමිණිලි ලැබී මසක් ඇතුලත විසඳීමට කටයුතු කිරීම

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2024 පෙබරවාරි 01 දින

ඇමුණුම 01

**නව විධානයන් නිකුත් කිරීම අවශ්‍ය ගැසට් පත්‍ර**

| අනු අංකය ------ | විධාන අංකය -------------- | නිරීක්ෂණය -------------- | නිරීක්ෂණයට හේතු පාදක කරුණු ---------------------------------- | නිර්දේශය ------------ |
|---|---|---|---|---|
| 01. | 20 හා 30<br><br>උපලේඛණයේ ඇති භාණ්ඩ විකුණන මිල හා සංශෝධිත මිල එහි බර හෝ ඝනත්වය වර්ගියනාමය සෑම දිස්ත්‍රික්කයට ඉදිරිපත් කල යුතු බව | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 10 වන වගන්තිය යටතේ විධානයන් නිකුත් කල යුතුය. | මෙම විධානය උපලේඛනගත භාණ්ඩ කිහිපයකට අදාලව නිකුත් වුවකි.එසේ උපලේඛනගත භාණ්ඩවල මිල වෙනස් වූ විට නිෂ්පාදකයින් හෝ ආනයනකරුවන් විසින් (වෙළඳපලට යොමු කරන භාණ්ඩවල හා වෙළඳපලේ පවතින භාණ්ඩවල වෙනස් වූ මිල) දින 21 ක් ඇතුලත දැනුම්දීමක් කරන ලෙස දක්වා ඇත.<br><br>මෙම විධානය යලි නිකුත් කිරීමෙන් වර්තමානයේ තෝරාගත් භාණ්ඩ කිහිපයක වෙළෙඳපල මිල සමීක්ෂණ මඟින් එම භාණ්ඩවල මිලෙහි වන සංශෝධනයන් පිළිබඳව තොරතුරු රැස් කර ගැනීම සඳහා වැය වන මිනිස් දින පිරිවැය අවම කරමින්,ඉක්මන් නිවැරදි තොරතුරු අධිකාරිය වෙත ක්‍රමවත්ව නිරායාසයෙන් ලබා ගැනීමේ හැකියාව පවතිනු ඇත. | • වෙළඳපල සමීක්ෂණයන් මඟින් උපලේඛනගත කලයුතු භාණ්ඩ ලැයිස්තුව සකස් කිරීම.<br>• වෙළඳපල අවශ්‍යතාව සලකා කාලානුරූපව භාණ්ඩ සියල්ලටම විධානය නිකුත් කිරීමට<br>• මිල දැන්වීම් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරවා ගැනීම.<br>• උප ලේඛනගත සෑම භාණ්ඩයකම නව මිල නිෂ්පාදකයන්, ආනයනකරුවන් වෙළඳපලට නිකුත් කිරීමට දින 14 කට පෙර දැනුම් දීමට නියෝග කිරීම.<br>• දැනට පවතින මිල සංශෝධිත නව මිල,වර්ගනාමය, බර පරිමාව හෝ ඝණත්වයන් ආදිය ද දැනුම්දීමට ඇතුලත්ව වාර්තා කරන ලෙස නියෝග කිරීම.<br>• පාරිභෝගික කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිෂ්පාදකයින් හා ආනයනකරුවන් වෙළෙඳපලේ භාණ්ඩවල මිල අත්තමෝමතිකව වැඩි කිරීමේ පාලනය කිරීමේ හැකියාව පවතී.<br><br>වෙළඳපලේ මිල හැසිරීම් පිළිබඳව පූර්ව තොරතුරු ලැබීමෙන් වෙළෙඳපල වැටලීම්, පාරිභෝගික පැමිණිලි, පාරිභෝගික සහන වැනි අධිකාරියේ කාර්යයන් පහසු කරවනු ඇත.<br><br>ඉහත ලැබෙන මිල තොරතුරු මඟින් කළමණාකාරිත්වයට තීරණ ගැනීමට පහසු වන ඇත.<br>මිල සංශෝධනයන් (වැඩි කිරීම්) පිළිබඳ ලැයිස්තුව නීතිගත කිරීමට අවස්ථාව ලැබේ. | පිළිබඳ අධිකාරි පනතේ 10(1) වගන්තිය යටතේ විධානයන් නිකුත් කල යුතුයි. |
| 02. | 54 හා 73<br>නිෂ්පාදකයකු හෝ වෙලන්දකු උපලේඛණයේ සඳහන් භාණ්ඩ තමාට සැපයුම්කරුගේ හෝ විකුණුම්කරුගේ අනන්‍යතාවය | 10(1) වගන්තිය යටතේ විධානයක් නිකුත් කළ යුතුය. | වෙළෙඳාම් කාර්යයේ නියැලෙන වෙළෙඳුන්, නිෂ්පාදකයින්, සාදන්නන් වෙත භාණ්ඩ තමා වෙත සැපයූ සැපයුම්කරුගේ අනන්‍යතාවය (නම, ව්‍යාපාරික හෝ පදිංචි ස්ථානය) ලිඛිතව තහවුරු කළ හැක්කේ නම් මිස සන්තකයේ තබා ගැනීම වරදක් බව නීතිගත කිරීමකි. | • සියලුම භාණ්ඩ (තොග හා සිල්ලර) (ආනයන හා දේශීය නිෂ්පාදන) වෙළඳාමට යටත් සියලු භාණ්ඩ ඇතුලත් කිරීම.<br>• ආනයනකරුවන්,නිෂ්පාදකයින් තොග හා සිල්ලර වෙළෙන්දන් වෙත විධානය කිරීම.<br>• 10(1) වගන්තිය යටතේ |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කලහැකි නව මිල විකිණීමට ප්‍රදර්ශනය කිරීම ගබඩා කිරීම නොකල යුතු බව | | මෙම විධානය උපලේඛනගත භාණ්ඩ සමූහයක් ලෙස එවකට නිකුත් කර ඇති අතර, වර්තමාන අධිකාරිය පනත යටතේ සියලුම භාණ්ඩ නීතියට යටත් වන බැවින් 26(1) වගන්තිය වැනි සියලුම භාණ්ඩ අදාල කරගත යුතුව ඇත.<br>අවිධිමත් ලෙස ව්‍යාජ අනුකරණ භාණ්ඩ වෙළඳපලට සැපයීම, තත්ත්වයෙන් බාල භාණ්ඩ සැපයීම, අධිකාරියෙන් නිකුත් කර ඇති අනෙකුත් විධානයන් කඩකිරීම හඳුනා ගැනීම, වෙළෙඳපලේ කටයුතු කරන නිෂ්පාදකයින් හා තොග වෙළෙඳුන් මෙමඟින් නියාමනය කල හැකිවන අතර, නීති විරෝධී අයුරින් රට තුලට ඇතුළු වන භාණ්ඩ සම්බන්ධයෙන් පාලනයක් සිදු කිරීමේ හැකියාව ඇත.<br>මෙම විධානය මඟින් අවසන් පරිභෝජනය සඳහා පාරිභෝගිකයින් වෙත භාණ්ඩ අලෙවි කරන සිල්ලර වෙළඳාම විධිමත් වනවා මෙන්ම සිල්ලර වෙළෙඳුන්ගේ ආරක්ෂාව සැලසෙන අතර එමඟින් පාරිභෝගික අයිතීන් සුරක්ෂිත වීම තහවුරු වනු ඇත. මෙම විධානය නිකුත් කිරීමෙන් අධිකාරිය පනතේ 11 වන | විධානයක් නිකුත් කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වගන්තිය සියලුම භාණ්ඩ සඳහා අදාල වනු ඇත. | |
| 03. | 57<br>රත්තරං, රත්තරං කාසි ස්වර්ණාභරණ හෝ කිසියම් රත්තරං නිෂ්පාදනයක් විකිණීමේදි එම නිෂ්පාදකයින් හා වෙලඳුන් විසින් භාණ්ඩය මිලදී ගනු ලබන තැනැත්තාට තොරතුරු ඇතුලත් කරමින් කුවිතාන්සි ලබා දීම. | 10(1) වගන්තිය යටතේ විධාන නිකුත් කල යුතුව ඇත. | වෙළෙඳපලේ ඉහළ වටිනාකමක් සහිතව අළෙවි වන ආකර්ෂණිය භාණ්ඩයක් වන රන් ආභරණ සම්බන්ධයෙන් විශ්වාසනීයත්වයක් සහ තත්ත්වයෙන් උසස් (කැරට් ප්‍රමාණය) රන් භාණ්ඩ වෙළෙඳපල සුළභ වීමෙන් පාරිභෝගික අයිතීන් සුරක්ෂිත වේ. රත්තරන් වෙළඳාමේදී විධිමත් කුවිතාන්සියක් නිකුත් කිරීම තුලින් රන් වෙළඳාමේ යෙදෙන කූඨ හා ව්‍යාජ වෙළෙඳුන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවස්ථාව සැලසේ. | • අධිකාරි පනත 10 වෙනි වගන්තිය යටතේ විධානය නිකුත් කිරීමට කටයුතු කිරීම අධිකාරි පනත යටත |
| 04. | 64<br>රෙදි ඔතා ඇති බටයක දෙකෙලවරේ රෙදි මීටරයක උපරිම සිල්ලර මිල පෙනෙන සේ තුණ්ඩුවක අමුණා සටහන් කර තිබීම. | 10(1)වගන්තිය යටතේ විධාන නිකුත් කළ යුතුව ඇත. | රෙදි වෙළෙඳාමේ යෙදෙන වෙළෙන්දන් විසින් රෙදි රෝල් (බටයක ඔතන ලද) හා ඉන් කපා වෙන් කළ කොටස් ලෙස අලෙවි කරන රෙදි වෙනුවෙන් මිල සඳහන් කිරීමට අදාළව නිකුත් වූ විධානයකි.<br>මෙම විධානය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීමෙන් පසු දෙපාර්තමේන්තුවේ නිලධාරින් අධිකාරියට 2005 දී අනුයුක්ත කර ගැනීමෙන් පසු එම නිලධාරීන් විසින් මෙම විධානයට අනුව වෙළඳපල | • අධිකාරි පනත යටතේ විධාන නිකුත් කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වැටලීම් සිදු කර නඩු පවරා ඇත.<br>විවිධ වර්ගයේ, මාදිලියේ, මෝස්තරයේ හා විවිධ පළලින් යුත් රෙදි එකම වෙළඳසැල තුල විකිණීමට ඉදිරිපත් කර තිබියදී එම එක් එක් වර්ගයේ රෙදි රෝලෙහි මිල පාරිභෝගිකයාට පහසුවෙන් අවබෝධ කර ගැනීම සඳහා මෙම විධානය නිකුත් කළ යුතුව ඇත.මේ මඟින් මිල වසන් කිරීම වලක්වා ගත හැකිය.<br>මිල ප්‍රදර්ශනය තුලින් රෙදි වෙළෙඳසැල් මිල නියාමනය වඩාත් පහසු වන අතර පාරිභෝගිකයා නිවැරදි තෝරා ගැනීමකට යොමු වීමෙන් පාරිභෝගික අයිතිය වඩාත් තහවුරු වේ. | |
| 05. | 86<br>කම්සයක ලකුණු කල යුතු උපදෙස් සටහන් කිරීම නොකර වෙලදාම් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකල යුතුයි. | 10 (1) වගන්තිය යටතේ නිකුත් කල යුතුව ඇත. | කමිස වෙළෙදාමට අදාල වන විධානයකි. එම විධානයට අදාලව 2003 න් පසුව වැටලීම් සිදු කර ඇති අතර මෙම විධානය මඟින් කමිස නිෂ්පාදකයන් හා වෙළෙඳුන් විසින් නියාමයන් අනුව කටයුතු කරන බැවින් තවදුරටත් එම නියාමනය පවත්වා ගැනීමටත්,එසේ නොකරන නිෂ්පාදකයින් හා අදාල වෙළෙඳුන් විසින් සඳහන් කිරීම සඳහා යොමු කරවා ගැනීම තුලින් පාරිභෝගික | අධිකාරි පනත 10(1) වගන්තිය යටතේ විධාන නිකුත් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අයිතිවාසිකම් තහවුරු කර ගැනීමේ හැකියාව ඇත. | |
| 06. | 89<br>ශ්‍රී ලංකා ප්‍රමිති 693 1995 සඳහන් මෝස්තර සහ පිරිවිතර වලට අනුකූල විය යුතුය. | 10(1) වගන්තිය යටතේ නිකුත් කල යුතුයි. | මෙය ජාතික කොඩිය සඳහා වන ප්‍රමිතිය සම්බන්ධයෙන් වන විධානයයි. මෙහි ජාතික වටිනාකම සලකා වර්තමානයේ ජාතික කොඩිය විකෘති වීම වැළැක්විය යුතුව ඇති බැවින් මෙම විධානය අධිකාරිය මඟින් නිකුත් කළ යුතු වීම. | අධිකාරි පනත 10(1) වගන්තිය යටතේ විධාන නිකුත් කල යුතුය. |
| 07. | 90<br>ඇසුරුමේ සිසිල් බිම් කරන ලද සිල්ලර මිල හා සිසිල් නොකරන ලද මිල වෙන් වෙන් වශයෙන් ලකුණු කර තිබිය යුතු බව. | 10(1) වගන්තිය යටතේ නිකුත් කල යුතුයි. | වෙළෙඳපලේ අලෙවි වන සිසිල් බීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද විධානයකි. සිසිල් බීම අලෙවියේ දී සටහන් කළ මිලට වඩා වැඩි මිලකට විකිණීමට පෙළඹීමක් ඇත. එය වර්තමානයේ අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි මඟින් තහවුරු වන අතර සිසිල් බීම අලෙවියේදී ශීත කරන ලද බීම සඳහා වැඩි මිලක් අය කිරීම ඊට හේතුව වේ. සිසිල් බීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් නිකුත් කල 68 වන විධානය යටතේ උපරිම සිල්ලර මිල (MRP) සටහන් කිරීමට උපලේඛන ගත භාණ්ඩයන් වන අතර එම සඳහන් මිල ඉක්මවා විකිණීමෙන් නිළධාරින් විසින් වැඩි මිල යටතේ වෙළෙන්දන් වරදකරුවන් කරයි. මෙම විධානය මඟින් ශීත කළ මිලක් | • වෙළෙඳපලේ අළෙවි වන ශීත කළ පානීය ජල බෝතල්,ශීත කළ කල් කිරි, පලතුරු බීම සඳහාද උපරිම සිල්ලර මිල ඉක්මවා ශීත කළ මිල ලෙස වැඩි මිලක් අයකරන බවට නිරන්තරයෙන් අධිකාරිය වෙත පැමිණිලි ලැබෙන බැවින් එම භාණ්ඩ ද ඇතුලත්ව විධානය නිකුත් කිරීම නිර්දේශ කිරීම.<br><br>• අධිකාරිය පනතේ 10(1) වගන්තිය යටත් විධාන නිකුත් කලයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | (CP) නියම වන අතර, ඒ මඟින් සිල්ලර වෙළෙන්දන් පත්වන අපහසුතාවයත් අධිකාරියේ නිලධාරින්ගේ කටයුතු පහසු කිරීමටත් හා පාරිභෝගිකයින් අපහසුතාවයට පත්වීමෙන් කරන පැමිණිලි අවම කරමින් සිසිල්බීම මිලෙහි පවතින සංකීර්ණතාවය මගහරවා සිසිල්බීම වෙළෙඳපල නියාමන කළ හැක. | |
| 08 | 58 හා 76 සබන් වල ඇසුරුමේ ඉදිරිපත් කල යුතු තොරතුරු | අධිකාරි පනත යටතේ විධානයක් නිකුත් කල යුතුව ඇත. | මෙම විධානය සබන් වර්ගීකරණය කර ප්‍රමිතියට ලක් කිරීම අරමුණු කරමින් නිකුත් කරන ලද්දකි.<br>වර්තමාන වෙළෙඳපලේ සබන් නිෂ්පාදන ප්‍රමිතිගත කිරීම තවදුරටත් සිදු කල යුතුව ඇත්තේ භාවිතයට නුසුදුසු (අහිතකර රසායනික සංයෝගය) නිෂ්පාදන වෙළෙඳපලේ ඇති බැවින් ප්‍රමිති පිරිවිතරයන්ට අනුකූලව නිෂ්පාදනයට යොමු කල යුතුව ඇත.<br>එමෙන්ම වත්මත් වෙළෙඳපලේ දී ද තත්ත්වයෙන් බාල සබන් නිෂ්පාදන සම්බන්ධයෙන් මෙම විධානය ක්‍රියාත්මක කළ යුතුව තිබුණ ද මෙම විධානය යළි නිකුත් කිරීමෙන් මහ හැරී තිබු විධානය ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබේ. | • සබන් වර්ගීකරණය පිළිබඳ අවධානය යොමු කිරීම.<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLS) විමසීම.<br>• නව විධානයන් අධිකාරි පනත යටතේ නිකුත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| 09 | 88<br>දුඹුරු සීනි වල ශ්‍රී ලංකා ප්‍රමිත 883-1990 අනුකූල වියයුතු බව | අධිකාරි පනත යටතේ විධානයක් නිකුත් කල යුතුව ඇත. | මෙම විධානය දුඹුරු සීනි ප්‍රමිතියට අනුකූලව වෙළෙඳපලට සැපයීම හා පවත්වාගෙන යෑම අරමුණු කර ගනිමින් නිකුත් වූවකි.<br>විධානය නිකුත් වූ අවධියේ මෙන්ම වත්මන් වෙළෙඳපල තුල ද දුඹුරු සීනි සඳහා ඉල්ලුමක් පවතින බැවින් එම භාණ්ඩයේ තත්වය උසස් මට්ටමින් පවත්වාගෙන යාම. | නව විධානයක් අධිකාරි පනත යටතේ නිකුත් කිරීම. |
| 10 | 104<br>ඉටිපන්දම් නිෂ්පාදනය | අධිකාරිය පනත යටතේ විධානයන් නිකුත් කළ යුතුය. | මෙම විධානය ඉටි පන්දම් නිෂ්පාදන ප්‍රමිතිගත කිරීම සඳහා නිකුත් කරන ලද්දකි.<br>වෙළෙඳපලේ දැනට විවිධ තත්වයේ ඉටි පන්දම් නිෂ්පාදන දක්නට ලැබෙන අතර අඩු ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන ඒ අතර වේ. ඉටි පන්දම්වල ප්‍රමිතිය උසස් තත්ත්වයෙන් පවත්වාගෙන යාම තුලින් පාරිභෝගික අයිතීන් තහවුරු කිරීම.<br>අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා ගැසට් නිකුත් කර තිබුණ ද ඒ පිළිබඳ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරින්ගේ අවධානය යොමු වීමක් දක්නට නොමැත.<br>මෙම විධානය මඟින් SLS | අධිකාරිය පනත යටතේ 12 වන වගන්තිය යටතේ විධානයන් නිකුත් කිරීම සුදුසුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලාංඡනය අනිවාර්ය කිරීමක් සිදු නොවන අතර ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරයන්ට අනුකූලවීමක් වන බැවින් ඕනෑම මට්ටමක නිෂ්පාදකයෙකුට වෙළෙඳපල තුල රැඳී සිටීමට බාධාවක් පැන නොගනී. | |
| 11 | 50<br>71<br>59 | නව විධානයන් නිකුත් කිරීමට ඇසුරුම් ඇතුලත් කල යුතු විස්තර | මෙම විධානය මගින් උපලේඛනගත භාණ්ඩ වල නිෂ්පාදකයාගේ නම,ලිපිනය හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ඔහුගේ වෙළඳ ලකුණ හෝ එම භාණ්ඩයේ ඇසුරුමේ සටහන් නොකර අලෙවි නොකල යුතු යැයි විධාන කිරීමකි.<br>මෙම විධානයෙන් අරමුණු කල කාර්යයට අනුකූලව (නිෂ්පාදකයාගේ නම හා වෙළඳ ලකුණ) අධිකාරිය පනත යටතේ 10(1) වගන්තිය යටතේ ඖෂධ හා හඳුන්කූරු වලට අදාලව (42 හා 45) නිකුත් කර ඇති අතර පාරිභෝගිකයාගේ ආරක්ෂාව සහ ගුණාත්මක භාණ්ඩ සැපයීම වෙනුවෙන් උපලේඛනගත භාණ්ඩ ප්‍රමාණයකට නිකුත් කිරීම. | • වත්මත් වෙළෙඳසැල් බොහොමයක් භාණ්ඩ වල වෙළඳ ලකුණු / නිෂ්පාදකයාගේ ආනයනකරුගේ නම ලිපිනය ඇතුලත් වුවද එය විධිමත් ලෙස නියාමනය වීම නිර්දේශ කිරීම.<br>• අධිකාරියේ 68 වන වගන්තිය යටතේ උපලේඛනගත භාණ්ඩ 76 ට වෙළඳ ලකුණ හෝ නම හෝ ලිපිනය සටහන් කිරීමට නිර්දේශ කිරීම.<br>• 68 වන විධානයට ඇතුලත් කල නොහැකි (කල් ඉකුත්වීමක් හෝ භාවිතයට වඩාත් සුදුසු දිනක් නිශ්වය කල නොහැකි) භාණ්ඩ ද වන බැවින් සියලුම භාණ්ඩ සඳහා විධානයක් නිකුත් කිරීමට නිර්දේශ කිරීම. |
| 12 | 91<br>ලුණු සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිති | නව විධානයක් නිකුත් කල යුතුව ඇත. | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිකුත් කළ ප්‍රමිති පිරිවිතරයට අනුකූවලවන්නේ නම් මිස | නව විධානයන් අධිකාරි පනත යටතේ නිකුත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | 79/87 ට අනුකූල වීම. | | විකිණීම නොකළ යුතුයැයි කිසියම් ලුණු වර්ගයක් නිෂ්පාදකයින් හා වෙළෙන්දන් වෙත නිකුත් කරන ලද්දකි. | |
| 13 | 55<br>60<br>90<br>ශ්‍රී ලංකා ප්‍රමිති 382,1984 අනුකූල විම | අධිකාරිය පනත යටතේ නව විධානයක් නිකුත් කල යුතුය. | මෙම විධානය මඟින් අභ්‍යාස පොත් සඳහා ප්‍රමිති පිරිවිතරයන් මඟින් තත්ත්වයෙන් උසස් අභ්‍යාස පොත් වෙළෙඳපලට නිකුත් කිරීම හා වෙළෙඳපලේ සුලභ කිරීමේ අරමුණින් නිකුත් කරන ලද්දකි. වර්තමාන වෙළෙඳපලෙහි තත්ත්වයෙන් උසස් අභ්‍යාස පොත් නිෂ්පාදනය වන අතර ඒ සඳහා මෙම විධානය හේතු වන බැවින් මෙම විධානය තවදුරටත් පවත්වාගෙන යා යුතු වීම. | නව විධානයන් අධිකාරි පනත 12 වෙනි වගන්තිය යටතේ නිකුත් කිරීම. |
| 14 | 94<br>95<br>ප්‍රමිති ලාංඡනය අනිවාර්ය කිරීම | | අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේ නිකුත් කර ඇති විධාන අංක 94 හා 95 මඟින් භාණ්ඩ වර්ග 08 ක ප්‍රමිති පිරිවිතරයට අනුකූලවීම සහ ප්‍රමිති ලාංඡනය දැරීම අනිවාර්ය කරමින් නිකුත්ව ඇත.<br>එම භාණ්ඩ 8 න් ව්‍යුහ වානේ දඬු, ව්‍යුහ වානේ කම්බි, සිමෙන්ති සඳහා අධිකාරිය පනත යටතේ SLS ලකුණු අනිවාර්ය කරමින් විධාන නිකුත් කර ඇත. රැලි වැටුණු,පැතලි ඇස්බැස්ටෝස් තහඩු ප්‍රමිති පිරිවිතර වලට | නව විධානයන් නිකුත් කිරීම නිර්දේශ කරමු. SLS ලාංඡනය ප්‍රායෝගිකව යෙදීම අපහසු ඉදි කිරීම් ක්ෂේත්‍රයට අදාල වෙනත් ප්‍රමිති පිරිවිතරයන් නිකුත්ව ඇති භාණ්ඩ ද නව විධානයට ඇතුලත්ව නිකුත් කිරීමට නිර්දේශ කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අනුකූල විය යුතු බවට අධිකාරිය විසින් විධානයක් නිකුත් කර ඇත. එම උපලේඛනයේ සඳහන් සිමෙන්ති බ්ලොක් ගල් සඳහා SLS ලකුණු යෙදීම ප්‍රායෝගික නොවන බැවින්, එහෙත් එය ප්‍රමිති ගත කිරීම සඳහා ප්‍රමිති පිරිවිතරයට අනුකූලවීම සඳහා පමණක් විධානයන් නිකුත් කිරීම. | |

**තවදුරටත් කරුණු සලකා බැලීමෙන් අනතුරුව විධානයන් නිකුත් කිරීම සුදුසු යැයි යෝජනා නර ඇති විධාන**

| අනු අංකය<br>------- | විධාන අංකය<br>---------- | නිරීක්ෂණයට හේතු පාදක කරුණු<br>------------------------------------ | නිර්දේශය<br>------------- |
|---|---|---|---|
| 1 | 65<br>68<br>93 | මෙම විධාන 3 මඟින් යටත් වූ භාණ්ඩ ලෙස ටින් මාළු උකු කිරි , කෘතිම රස පාන (Synthetic Codial) ,අලුත් පලතුරු රස පාන, පලතුරු රස පාන සාර, පලතුරු සිරප් සාර ,පිළිගැන්වීමට සූදිනම් පලතුරු බීම ඇතුළත් වේ.<br>මෙම විධානයේ අරමුණු වී ඇත්තේ පාරිභෝගිකයාට තත්වයෙන් උසස් ප්‍රමිතිගත ඉහත භාණ්ඩ මිල දී ගැනීමට අවස්ථා සැලසීමයි.එසේ වුවද මෙම විධාන ක්‍රියාත්මක කිරිමේදී වෙළෙඳපලට පිවිසෙන සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් (දේශීය) හට වෙළෙඳපලට පිවිසීමට බාධකයක් වන හෙයින් මේ පිළිබඳව තවදුරටත් විමර්ශනය කිරීම සුදුසු වේ.<br>තත්ත්වය එසේ වුවත් මෙහි සම්බන්ධ ඇතැම් භාණ්ඩ සම්බන්ධයෙන් අධිකාරියේ ඇතැම් නිලධාරීන් ද ඉහත විධාන 93 පදනම් කර ගනිමින් (ටින්මාලු,පලතුරු බීම) නඩු පැවරීම් සිදු කර ඇත. | • උපලේඛනගත භාණ්ඩ නිෂ්පාදකයින් සමඟ අධිකාරිය සාකච්ඡාකොට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.<br><br>• ඉහත භාණ්ඩ සුළු පරිමාන නිෂ්පාදකයින් හා සම්බන්ධ විධිමත් ආයතන සමඟ (කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකයේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය ව්‍යවසායකත්ව සංවර්ධන ආයතනය NEDA) අදහස් හුවමාරු කර ගැනීම. |
| 2 | 69 | මෙම විධානය 1. ගෘහස්ථ විදුලි ස්විච්, 2. ගෘහස්ථ විදුලි පේනු හා පිටවාන, 3. ගෘහස්ථ විදුලි පහන් අල්ලු, 4. ගෘහ තාපක තැටි, 5.විදුලි බල්බ ප්‍රමිතිගත කිරීම අරමුණින් නිකුත් කරන ලද විධානයකි.<br>මහජන උපයෝගිතා කොමිසම මැදිහත්ව වර්තමානයේ අධිකාරිය පනත මඟින් ඉහත භාණ්ඩ කිහිපයක් ආවරණය වන පරිදි ප්‍රමිතිගත විධානයන් නිකුත් කර ඇති අතර එසේ නොවන භාණ්ඩ සඳහා විධානයන් නිකුත් කිරීමට සලකා බැලිය යුතු බව හැඟේ. | • ගෘහ තාපක තැටි විදුලි බල්බ වෙනුවෙන් වන විධානයන් නිකුත් කිරීම.<br><br>• ඒ සඳහා මහජන උපයෝගිතා කොමිසම විමසීම. |
| 3 | 78<br>79<br>83 | මෙම විධානය සහල් නිෂ්පාදනය ප්‍රමිතීන් අනුකූල කිරීම හා තොරතුරු ලේබල් කිරීම අරමුණු කර ගනිමින් කරන ලද්දකි. | • සහල් ශ්‍රේණිගත කිරීම පිළිබඳ ප්‍රමිති ආයතනය විමසීම. |

| | | | |
|---|---|---|---|
| | 53 | වත්මන් වෙළෙඳපලේ බොහෝ විට පාරිභෝජනයට සුදුසු සහල් වර්ග තිබුණත් තව දුරටත් ප්‍රමිතියට අනුකූල වූ සහල් නිෂ්පාදන කිරීම සම්බන්ධයෙන් මෙම විධානය නිකුත් කළ යුතුව ඇත.<br>අධිකාරිය විසින් මෑතක නිකුත් කළ 68 වන විධානය මඟින් ඇසුරුම් කරන ලද සහල් සම්බන්ධයෙන් තොරතුරු 07 ක් සඳහන් කිරීම අනිවාර්ය වුවද නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය, අස්වැන්න නෙළාගත් වර්ෂය සහ මාසය සහල් වර්ගය (කැකුළු,තම්බපු) නාඩු (රතු,සුදු) රතු කැකුළු, සුදු කැකුළු, සම්බා, කීරි සම්බා වර්ග වැනි සහ සහල් ශ්‍රේණිගත කිරීම (විශේෂ 1,2,3 හා අවශේෂි) යන කරුණු සටහන් කිරීම ඉතා වැදගත් බැවින් අධිකාරි පනත යටතේ නව විධානයන් නිකුත් කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. | • සහල් නිෂ්පාදකයින්ගේ අදහස් විමසීම.<br>• පාරිභෝගික කටයුතු පිළබඳ අධිකාරිය විසින් නිකුත් කර ඇති 68 වන විධානයේ ඇතුලත්ව ඇති ඇසුරුම්ගත සහල් ඉවත්කොට සහල් සඳහා වෙනම විධානයන් නිකුත් කිරීම. |
| 4 | 85 | මෙම විධානය ඊයම් අම්ල කෝෂ (බැටරි) සඳහා යොදා ගන්නා ජලය (ඩිස්ටිල් වෝටර්) ප්‍රමිතිගත කිරීම සඳහා නිකුත් කරන ලද්දකි. | • වෙළඳපල විමර්ශනයකට ලක් කර අවශ්‍යතාවය තීරණය කිරීම සහ අදාළ රජයේ පාර්ශවයේ අදහස් විමසීම. |
| 5 | 03<br>04<br>44<br>87<br>107 | මෙම විධානයේ ළදරු කිරිපිටි,ළදරු කිරි ආදේශක වට්ටෝරු,මව් කිරි දීම ප්‍රවර්ධනය නම් කළ නිෂ්පාදන (සුප්පු,කිරි බෝතල්) වැනි කරුණු අරමුණු කොට ගත් විධානයකි.<br>ඒ අනුව වත්මන් වෙළඳපල තුල ද නියාමනය විය යුතු විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු භාණ්ඩ ලෙස සළකා කටයුතු කළ යුතුව ඇත.<br>විධාන අංක 107 යටතේ නිකුත් කර ඇති " මව් කිරි දීම,ප්‍රවර්ධනය කිරීම සහ නම් කළ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ වූ ශ්‍රී ලංකා නීති සංග්‍රහය" සංකීර්ණ බැවින්ද,එය නීත්‍යානුකූල බවට අදාල කමිටු පිහිටුවීමේ දී අමාත්‍යාංශය හා ආයතන කිහිපයක දායකත්වයෙන් යුතුව ඇති බැවින් වර්තමානයේ මෙවැනි කමිටු ස්ථාපනය වී නොමැති බැවින් මෙම | • සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ වෙනත් අදාල ආයතන හා සාකච්ඡා කර විමසා බැලීම.<br>• මෙම කරුණු වෙනත් ආයතන මඟින් නියාමනය නොවේ නම් නව ගැසට් පත්‍රයක් නිකුත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | ගැසට් පත්‍රය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව ගැටළු සහිත වීම. | |
| 6 | 14<br>100 | මෙම විධානය දුම්වැටි භාවිත කරන්නන් අධෛර්යමත් කිරීම සඳහා සෞඛ්‍යමය අවධානම් ප්‍රකාශයන් සටහන් කිරීම අනිවාර්ය කරමින් නිකුත් කර ඇති විධානයකි.<br>වර්තමානයේද සිගරට් පැකට් වෙළෙඳපලට නිකුත් කිරීමේදී මෙම ප්‍රකාශය සටහන්ව පවත්නා අතර මෙම විධානය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ඇත. දුම්වැටි අධෛර්යමත් කිරීමේ අරමුණින් රුපමය අවවාද සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන මඟින් නීතිගත කර ඇති අතර තවදුරටත් නව විධානයන් අධිකාරී පනත යටතේ නිකුත් කිරීමේ අවශ්‍යතාවය සළකා බැලිය යුතුව ඇත. | • තවදුරටත් මෙමඟින් සිදුවන දුම්වැටි භාවිත කරන්නන් අධෛර්යමත් කිරීම කළ යුතු බව නිර්දේශ කරමි.<br><br>• දුම්වැටි භාවිතය අධෛර්යමත් කිරීමට කටයුතු කරන අනෙකුත් ආයතන වල නීතිමය තත්ත්වය හා ඇති බලපෑම විමසීම. |
| 7 | 70 | 1986 මැයි මාසයේ නිකුත් කරන ලද මෙම විධානය මඟින් උපලේඛනගත භාණ්ඩ (ක්ෂණිකව ආහාරයට ගත හැකි) නිෂ්පාදනය හා විකිණීමේදී කොමසාරිස් වෙත ලිඛිතව තොරතුරු සැපයීම කළ යුතු බවයි.<br>• නිෂ්පාදකයාගේ නම ලිපිනය, භාණ්ඩ ලැයිස්තුව<br>• නිෂ්පාදන සඳහා රජයේ අනුමැතිය ලැබී තිබේද?<br>• ව්‍යාපාරය සමාගම් රෙජිස්ට්‍රාර් ලියාපදිංචි කර ඇත්ද? යන කරුණු ඊට අදාලව විධානය වී ඇති අතර ඒ තුලින් අවිධිමත් ආහාර නිෂ්පාදන වෙළෙඳපලට පිවිසීම හා වෙළෙඳපලේ පැවතීම වැළැක්වීම අරමුණුකොට ඇත.<br>ලැයිස්තුගත භාණ්ඩ සමූහය සෘජුවම ආහාරපාන සඳහා සම්බන්ධ වන බැවින් වර්තමානයේ ඒ හා සම්බන්ධව නියාමන ආයතන මඟින් විධිමත් ලෙස ආහාරපාන නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ක්‍රියාවලි හා භාණ්ඩ නිශ්චිත ප්‍රමිති හඳුන්වාදීමක් සිදු වී ඇති ද | • ආහාර සහ පාන සම්බන්ධයෙන් වන විධානයක් වන බැවින් උපලේඛනගත භාණ්ඩ ලැයිස්තුව පුළුල් කිරීමට නිර්දේශ කිරීම.<br><br>• වෙනත් නියාමන ආයතනය විමසීම.<br><br>• කරුණු සළකා බැලීමෙන් අනතුරුව නව විධානයන් නිකුත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | යන්න සළකා බැලිය යුතුයි.<br>එය වෙනත් නියාමන ආයතනයක් මඟින් නීති ප්‍රතිපාදනය වී නොමැති නම් තවදුරටත් සලකා බලා විධානයක් නිකුත් කල යුතුය. | |
| 8 | 72 | ආහාර පිසීම සඳහා භාවිතා කරනු ලබන කිසිම ආනයනික එළවළු තෙල් වර්ගයක් එය නිස්සාරණය කිරීම සඳහා ගනු ලබන එළවළු වර්ගය/වර්ග ඒ සඳහා යෙදූ ආකලන (additives) ආරක්ෂණ ද්‍රව්‍ය (Preservatives) හා පාට කිරීමේ ද්‍රව්‍ය (Colorings) සහ වෙනත් ද්‍රව්‍ය (Any Other Substance) දෙන ලද කිසියම් පරිමාවකට එම ද්‍රව්‍ය පිළිබඳව පැහැදිලි සටහන් කළ යුතුය යන්න විධානය කිරීමකි.<br>වර්තමානයේ අධිකාරිය පනතේ 10 වෙනි වගන්තියෙන් නිකුත් කරන ලද 62 විධානය මඟින් ආහාරයට ගන්නා තෙල් වර්ග ලෙස ඉහත භාණ්ඩයට ද අදාලව විධානය නිකුත් වී ඇත.<br>එහි දක්වා ඇති කරුණු 09 ක් වන අතර මෙම විධානය මඟින් ඊට අමතරව කරුණු 05 ක් ඇති බැවින් එම කරුණු ද ඇතුළත් කර යළි නිකුත් කිරීම. | • අධිකාරිය විධාන අංක 62 යටතේ ආහාරයට ගන්නා තෙල් වර්ගය සඳහන් කිරීම නිශ්චිතව දක්වා නොතිබීම නව විධානය ඇතුලත් කිරීම නිර්දේශ කිරීම. (උදා:- එළවළු තෙල්,පොල් තෙල්, සූරියකාන්ත තෙල්)<br>• මිශ්‍රිත තෙල් වර්ගයක් නම් සාදන ලද (අනුමත) කිසියම් පරිමාවකට එම ද්‍රව්‍ය ඇතුලත් ඇතුලත් ප්‍රමාණයක් ද ලේබලය සඳහන් කිරීමට නිර්දේශ කරමු.<br>• විධාන අංක 62 ට සංශෝධනයක් මඟින් තොරතුරු ඇතුලත් කිරීම.<br>එමඟින් පැරණි විධානයට ඇතුළත්වූ ආනයනික ආහාරයට ගන්නා එළවළු තෙල් වලට පමණක් සීමා වූ කරුණු ආනයනික දේශීය ආහාරයට ගන්නා තෙල් වලටද අදාල වේ. |
| 9 | 92 | මෙම විධානය නිකුත්ව ඇත්තේ ප්‍රසිද්ධ පාරවල්වල පැද යන කිසියම් වර්ගයේ පා පැදියක් අලෙවි කිරීමේ දී එහි උපලේඛනගත කොටස් සම්බන්ධයෙන් ප්‍රමිති පිරිවිතරයන්ට අනුකූල විය යුතුය යන්නයි.<br>එම කොටස් ප්‍රමාණය සලකා බැලීමේදී පාපැදියක උසස් තත්ත්වයට අදාල අනෙකුත් ප්‍රධාන අමතර කොටස් පිළිබඳව ප්‍රමිති පිරිවිතරයන් නිකුත් කර ඇත් ද යන්න සළකා බැලිය යුතු හෙයිනි. | • නව විධානයක් නිකුත් කල යුතුව ඇත.<br>• නව විධානයක් නිකුත් කිරීමේ දී පා පැදිය හෝ අමතරව කොටස් වෙනුවෙන් සංශෝධිත නව ප්‍රමිති පිරිවිතරයන් කෙරෙහි අවධානය යොමු කිරීම. |

ඇමුණුම 03

අවලංගු කල යුතු විධාන

| අනු අංකය<br>---------- | විධාන අංකය<br>---------- | නිරීක්ෂණයට හේතු පාදක කරුණු<br>------------------------------------ |
|---|---|---|
| 01 | 05<br>105 | මෙම විධානයන් ඖෂධ වල තොග හා සිල්ලර මිල ප්‍රදර්ශනය,ලකුණු කිරීම අරමුණු කරගෙන නිකුත් වූවකි.<br>ඖෂධ සම්බන්ධයෙන් මේ වන විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 10(1) වගන්තිය යටතේ විධාන අංක 42 නිකුත් කර ඇත. එම විධානය මඟින් මිල සටහන් කිරීමට අමතරව ඖෂධ පාරිභෝජකයින්ගේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය වන වෙනත් තොරතුරු ගණනාවක් සහිත ශක්තිමත් විධානයක් නිකුත් වීමෙන් මෙම (පැරණි) විධානයන්ගේ අවශ්‍යතාවය පැන නොනගී. |
| 02 | 18 | මෙම විධානය භූමිතෙල් සිල්ලරට විකිණීමේ දී ප්‍රමාණයන්ට අනුකූල වන මිල ප්‍රදර්ශනය කිරීම අරමුණුකොට නිකුත් වූවකි.<br>ශ්‍රී ලංකා වෙළෙඳපල තුල කිරුම් මිණුම් ඒකක මෙට්‍රික් ක්‍රමයට පරිවර්තනය වන යුගයේඑය අවධාරණය කරමින් නිකුත් කරන ලද්දක් බැවින් හා වර්තමානයේ අධිකාරියේ 26(1) වගන්තියට යටත්ව මිල ප්‍රදර්ශනය නියාමනය වන බැවින් නව විධානයන් නිකුත් කිරීමට අවශ්‍ය නොවීම. |
| 03 | 21 | මෙම විධානය උපලේඛනගත භාණ්ඩ රාශියකට (78) මිල සටහන් කිරීම භාණ්ඩයේ ඇසුරුමේ,භාජනයේ සටහන් කළ යුතු බව දන්වමින් නිකුත් කරන ලද්දකි.<br>මේ වන විටත් අධිකාරියේ විධාන අංක 68 මඟින් යටත් කර ඇති උපලේඛන ගත භාණ්ඩ 76 ට මෙම බොහොමයක් භාණ්ඩ ඇතුළත්ව තිබීමත් ඉතිරිය අධිකාරි පනතේ 26(1) වගන්තිය යටත්ව මිල ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය බැවින් යටතේ ආවරණය වන බැවින් නව විධානයක් නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොගනී. |
| 04 | 26 | මෙම විධානය සාප්පු මලු (ෂොපින් බෑග්) නිපදවන නිෂ්පාදකයන්ට එක් එක් මල්ලේ මිල සටහන් කිරීමකි.<br>මෙම නීතිමය කාරණය අධිකාරියේ 26(1) වගන්තියෙන් ආවරණය වේ. මෙම විධානය කාලානුරූපව අවශ්‍ය නොවන බව පෙනේ. |
| 05 | 27 | මෙම විධානය මඟින් අරමුණුකොට ඇත්තේ 1980 වසරේ ශ්‍රී ලංකා වෙළෙඳපල තුල කිරුම් මිණුම් ඒකක මෙට්‍රික් ක්‍රමයට පරිවර්තනය වීමත් සමඟ සෑම භාණ්ඩයක්ම විකිණීමේ දී කිරා විකුණන්නේ නම් ග්‍රෑම් ලෙස ද මැන විකුණන්නේ නම් මීටර් ලෙස ද ස්කන්ධය අනුව ලීටර් ලෙස ද විධානය කිරීමකි.<br>කාලානුරූපව විධානයක් නිකුත් කිරීම අවශ්‍ය නොවේ. |

| | | |
|---|---|---|
| 06 | 35 | මෙම විධානය මඟින් යතුරු පැදි ධවකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පළඳින හිස් වැසුම් වඩා ආරක්ෂාකාරී වීම සඳහා එවකට කරන ලද නියාමනයකි.වත්මත් අධිකාරිය පනත මඟින් 12 වන වගන්තිය යටතේ විධාන අංක 59 අනුව ආරක්ෂක හිස්වැසුම් SLS ලාංඡනය අනිවාර්යය කරමින් පාරිභෝගික සුරක්ෂිතතාවය වඩාත් තහවුරු කර ඇත. |
| 07 | 39 | මෙම විධානයේ අරමුණු වී ඇත්තේ වෙළෙන්දෙකු විසින් භාණ්ඩ විකිණීමේ දී කොන්දේසි සහිත වෙළෙඳාම තුළින් පාරිභෝගිකයාට වන අසාධාරණය වැළැක්වීමයි.<br>එවකට විධානයන් නිකුත් කිරීම මඟින් අරමුණු කරගත් කොන්දේසි සහිත වෙළෙඳාම වැලැක්වීම අධිකාරිය පනතේ 16 වන වගන්තිය මඟින් භාණ්ඩ විකිණීමේ දී " මිල නොපමාව ගෙවි යුතුය " යන කොන්දේසි හැර වෙනත් කිසිම කොන්දේසියක් පැනවීම වළක්වාලමින් පනතේ වගන්තියක් තුලින්ම දක්වා ඇත. |
| 08 | 41<br>48 | මෙම විධානයන් මඟින් උපලේඛනගත භාණ්ඩවල මිල සටහන් කළ යුතු බව අරමුණු කර ඇත.අධිකාරි පනතේ 10(1) වගන්තියෙන් මෙම උපලේඛනගත භාණ්ඩ ප්‍රමාණයට අමතරව මිල හා අනෙකුත් තොරතුරු සටහන් කිරීමට 68 වන විධානයෙන් විධානය කර ඇති අතර එයට අඩංගු නොවන අනෙකුත් භාණ්ඩ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 6(1) වගන්තියේ මිල ප්‍රදර්ශනයට යටත්ව ඇත. |
| 09 | 42 | මෙම විධානය මඟින් එවකට අදාළ අමාත්‍යාංශය යටතේ සංවිධානය කරන ලද මහපොළ භූමිය තුල සිදුවන වෙළඳාම නියාමනය කිරීම හා අනුමැතිය ලබා දීම පිණිස නිකුත් කරන ලද්දකි. වත්මත් අධිකාරි පනත යටතේ වෙළෙඳාම නියාමනයට මෙවැනි උත්සව භූමි ද ඇතුළත් වන අතර මෙම විධානය කාලානුරූපව අවශ්‍යතාවයක් පැන නොගනී. |
| 10 | 45 | මෙම විධානය මඟින් මෝටර් රථ වාහනයක් සඳහා නව බැටරියක් මිලදී ගන්නා පාරිභෝගිකයෙකු ලබා දෙන පාවිච්චි කරන ලද පැරණි බැටරියේ මිල නියාමනය සඳහා මෙන්ම බැටරි වැඩි මිලට විකිණීම වැලැක්වීම, තැන්පතු මුදලක් ඉල්ලා සිටීම වැලැක්වීම අරමුණු කර ගනිමින් නිකුත් කර ඇත.<br>මෙය කාලානුරූප නොවන බැවින් හා අධිකාරි පනතේ වගන්ති සහ විධානයන්ට යටත්ව වෙළඳාම නියාමනය වීම සිදුවන බැවින් විධානයක් නිකුත් කල යුතු නොවේ. |
| 11 | 46 | මෙම විධානය මඟින් බුලත් සමඟ කෑමට ගන්නා හුණු පොලිතින්වල ඇසුරුම් කර විකිණීම නියාමනය කිරීම අරමුණු කරගෙන ඇත.<br>මෙය පරිභෝජනය අධෛර්යමත් කළ යුතු භාණ්ඩයක් ලෙස පෙනෙන බැවින් හා |

| | | |
|---|---|---|
| | | පරිභෝජනය කරන පිරිස වර්තමානයේ අඩුවක් දක්නට ලැබෙන හෙයින් ඒ කරම් කාලීන නොවේ.තවද මෙවැනි භාණ්ඩ සඳහා විධාන නිකුත් කිරීම මඟින් මෙවැනි භාණ්ඩ ප්‍රවර්ධනය වීමක් සිදුවීමට ඇති බැවින් එය වැළැක්වීම සුදුසු වේ. |
| 12 | 49<br>102 | මදුරු දඟරවල ප්‍රමිතිය උසස් තත්ත්වයකට ගෙන ඒම මෙම විධාන නිකුත් කිරීමේ අරමුණු වී ඇත.<br>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(1) වගන්තිය යටතේ විධාන අංක 47 මඟින් මදුරු දඟරවල ප්‍රමිතිය අනිවාර්ය කර ඇත. |
| 13 | 56<br>82 | පානීය ඇල් ජලය සැපයුම් සඳහා භාවිතා කරන නල හා උපාංග ප්‍රමිතියට අනුකූල කිරීම සඳහා කළ විධානයකි.<br>අධිකාරි පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කල අංක 25 දරන විධානය මඟින් SLS ලාංඡනය දරන්නේ නම් මිස නිෂ්පාදනය,විකිණීම,ගබඩා කිරීම හා බෙදා හැරීම නොකල යුතු බවට විධානය කර ඇත.එම නිසා මෙම විධානයේ බලාත්මක බව අහෝසි වී ඇත. |
| 14 | 62<br>63<br>97<br>98 | මෙම විධානය ගෙනි පෙට්ටි ප්‍රමිති ගත කිරීම සඳහා SLS ප්‍රමිති පිරිවිතරයට අනුව නිෂ්පාදනය කිරීමට හා වෙළෙඳාම් කිරීමට විධානය කිරීමකි.<br>පාරිභෝගික අධිකාරිය පනතේ 12 වන වගන්තිය යටතේ විධාන අංක 41 විධානය මඟින් ගිනි පෙට්ටි වෙළඳාම හා විකිණීම වත්මත් වෙළෙඳපොළ තුල විධිමත් කිරීම පිණිස SLS අනිවාර්ය කර ඇත. |
| 15 | 66 | මෙම විධානයේ සඳහන් උපලේඛනයේ ඇතුළත් භාණ්ඩ වර්ග 4 අධිකාරිය මඟින් 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන අංක 68 යටතේ උපලේඛන ගත භාණ්ඩ ලැයිස්තුවේ ඇතුළත්ව ඇත.<br>පැරණි විධානය මඟින් විධානය කල ඉහත කරුණු පාරිභෝගික අධිකාරි පනතේ නිකුත් කළ විධානයෙන් ආවරණය වී ඇත. |
| 16 | 67 | මෙම විධානය මඟින් ඇස්බැස්ටෝස් තහඩු නිෂ්පාදනයේදී ක්‍රොසිඩ් ඩොලයිට්, (නිල් ඇස්බැස්ටෝස්) උපයෝගී කර නොගෙන නිෂ්පාදනය කර ඇති බවට ලිඛිතව සහතික කිරීමත් සමඟ විකිණීමට හා ඒ බව දැන්වීම මඟින් ප්‍රචාරණය කල යුතු බවට කරන ලද විධානයකි.<br>මෙම භාණ්ඩයේ තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා අධිකාරි පනතේ 12 වගන්තිය යටතේ විධාන අංක 13 මඟින් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නොවන ඇස්බැස්ටෝස් විකිණීම,විකිණීමට ප්‍රදර්ශනය කිරීම තහනම් කර ඇත. |
| 17 | 75 | මෙම විධානය කුමන හෝ දන්තාලේප වර්ගයක් ප්‍රමිති පිරිවිතරයන්ට අනුකූල කිරීමකි.<br>පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 28 වන විධානය මඟින් |

| | | |
|---|---|---|
| | | දන්තාලේප සඳහා SLS ලාංඡනය දැරීම අනිවාර්ය කර ඇත. |
| 18 | 77 | කිසියම් භාණ්ඩයක් අළෙවි ප්‍රවර්ධනය සඳහා වෙළෙඳ දැන්වීමක් ප්‍රචාරණය කිරීමේදී සෑම භාණ්ඩයකම එහි සිල්ලර මිල එම දැන්වීමේ සඳහන් කළ යුතුය යන්න විධානය කිරීමකි.<br>අධිකාරි පනතේ 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 32 වන විධානය මඟින් ඉහත කරුණට අදාළව විධානයක් නිකුත් වී ඇත. |
| 19 | 84 | මෙම විධානය මඟින් ඖෂධීය බෙහෙත් වර්ගයක් හෝ හෛෂජ්ජිත ද්‍රව්‍යයක් විකිණීමේ දී ද්‍රව්‍ය නාමය, වෙළෙඳ නාමය සටහන් කර ඇත්නම් එය විකිණීම සිදු නොකළ යුතු යැයි විධානය කිරීමකි.<br>අධිකාරිය පනතේ 10(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද 42 වන විධානයෙන් මෙම කරුණ හා වෙනත් වැදගත් විධිමත් කරුණුද ඇතුළත්ව විටමින් වර්ග ද ඇතුළත්ව විධානයක් නිකුත් වී ඇත. |
| 20 | 101 | මෙම විධානය නිකුත් කර ඇත්තේ කිරිපිටි ඇසුරුම් හි නිෂ්පාදන දින, කල් ඉකුත් වන දින, ඇසුරුම් කරන ලද දිනය, ලකුණු කරන ලෙස විධානය කිරීම අරමුණ කර ගනිමිනි.<br>අධිකාරිය පනතේ 10(1) වගන්තිය යටතේ අංක 68 දරන විධානය මඟින් වඩාත් විධිමත් ලෙස මෙම ආවරණය ලබා දී ඇත. |
| 21 | 103 | මෙම විධානය මස් හා මස් ආශ්‍රිත නිෂ්පාදයන්හි මිල සම්බන්ධයෙන් නිකුත් කරන ලද විධානයකි.<br>පාරිභෝගික කටයුතු අධිකාරිය පනතේ 26 වගන්තියෙන් හා පනතේ 10(1) යටතේ නිකුත් කර ඇති විධාන අංක 68 මඟින් පැරණි විධානයෙන් අරමුණු කර ගන්නා ලද කරුණු ආවරණය කර ඇත. |

ඇමුණුම 04

**නියමිත ප්‍රමිතියට අනුකූල නොවූ භාණ්ඩ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වූ අවස්ථාවන්**

| සාම්පල් පරීක්ෂාව **-2020** | | | | | |
|---|---|---|---|---|---|
| අංකය<br>----- | සාම්පල වර්ගය<br>----------- | සාම්පල එකතු කල දිනය<br>--------------- | වාර්තාව ලැබුණු දිනය<br>---------------------- | ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග<br>------------------------------- | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාද වන කාලය සාම්පල එකතු කළ දින සිට (මාස)<br>-------------- |
| 1. | Rice | 2019.12.31 | 2020.02.05 | Maligakanda Magistrate Court, Case No.- 16342,16343 Fines -Rs.7500.00, Rs.7500.00 Case filed Date – 2021.06.30 | 18 |
| 2. | Rice | 2019.12.31 | 2020.12.02 | Case No. 16344/20 Fine -Rs. 7500.00 Magistrate Court – Maligakanda Case filed Date 2021.06.30 | 18 |
| 3. | Tea | 2020.01.09 | 2020.02.17 | Case No. 21676/20 Fine -Rs. 7500.00 Magistrate Court – Maligakanda Case filed Date – 2020.08.18 | 07 |
| 4. | Chilli Pieces &Chilli Powder | 2020.02.20 | 2020.06.22 | Maligakanda Magistrate Court, Case No.-28505/20 Fines -Rs.20000.00 Case filed Date – 2020.10.06 | 08 |
| 5. | Bottled | 2020.03.03 | 2020.06.23 | Awissawella | 20 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | Drinking Water | | | Magistrate Court,<br>Case No.-67784<br>Fines -Rs. 15000.00<br>Filed date – 2021.11.19 | |
| 6. | Chilli Powder | 2020.05.06 | 2020.07.03 | Maligakanda Magistrate Court,<br>Case No.-26459/20<br>Fines -Rs.10000.00<br>Filed date – 2020.09.22 | 04 |
